# වාර්ෂික වාර්තාව

# 2012

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

## සභාපතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපතිවරයා ලෙස එහි 2012 වාර්ෂික වාර්තාවට මෙම කෙටි පණිවුඩය ගෙන එන්නේ බලවත් සතුටිනි.

මෑත අතීතය තුලදී දිවයිනෙහි බලශක්ති උත්පාදන කර්මාන්තය එහි විශ්වාසය ජල ප්‍රභවයන්ගේ සිට තාප බලශක්තිය කරා සැලකිය යුතු ලෙසින් විතැන් කර ඇත. අපේම වූ ගල්අඟුරු හෝ තෙල් සම්පත් නොමැති ශ්‍රී ලංකාව බොරතෙල් ආනයනය මත විශාල වශයෙන් යැපීමට සිදු කරවන මෙම තත්ත්වය සම්බන්ධයෙන් සැලකිල්ලෙන් විමසා බැලිය යුතු වේ. ඉන්ධන සඳහා වැඩිවන ගෝලීය ඉල්ලුම හා සබැඳුනු මිල ගණන් ඉහළ යෑම දිවයිනෙහි ආර්ථිකය එහි වඩාත් සතුටුදායක තත්ත්වයෙහි නොතබනු ඇත. එබැවින් දිවයිනෙහි බලශක්ති ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා වන තිරසාර ප්‍රවේශයක් සඳහා ලැබිය යුතු සැලකිල්ල දැක්විය යුතු වේ. 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති පනතින් ස්ථාපිත ශ්‍රීලසුබඅ, දිවයිනෙහි පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය සහ බලශක්ති සංරක්ෂණය ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාවට නැංවීම සිදු කරන කේන්ද්‍රීය රාජ්‍ය ආයතනයයි. අධිකාරියෙහි ප්‍රධාන අරමුණ වන්නේ පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති කාර්යක්ෂමතාව සහ ඵලදායී බලශක්ති සැපයීම සඳහා පහසුකම් සැපයීම

මඟින් බලශක්ති සංරක්ෂණය යථාර්ථයක් බවට පත් කර ගැනීම සඳහා රජයට සහාය දැක්වීමයිජාතික ප්‍රතිපත්ති සම්පාදනයෙහි මෙම සංකල්පයෙහි ඇති වැදගත්කම අවධාරණය

කරමින් “මහින්ද චින්තන-ඉදිරි දැක්ම” තුලින් වර්ෂ 2020 වනවිට නව පුනර්ජනනීය බලශක්තිය මඟින් ජනනය කරන ලද විදුලියෙන් ජාල විදුලිය සඳහා වන දායකත්වය 20%කින් සහ සත්‍ය පරිභෝජනයට බලශක්තිය ඉතිරි කිරීමේ නැඹුරුතාවය 8.7කින් ඉහළ නැංවීමටත් ඉලක්කගත කර ඇත. මෙම ඉලක්ක සාක්ෂාත් කර ගැනීම, දිවයිනෙහි පවතින ප්‍රමාණවත් පාරම්පරික සම්පත් භාවිතයට ගැනීම ප්‍රවර්ධනය කිරීමට සහ බලශක්ති ක්ෂේත්‍රය වඩා බලශක්ති කාර්යක්ෂම සහ පරිසර හිතකාමී බවට පත් කරීමට හේතු වනු ඇත. පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වන කුඩා-ජල විදුලි, සුළං සහ ජෛවස්කන්ධ, සංකල්පමය වශයෙන් සහ භාවිතය අතින් වැඩි අවධානයක් හිමි කරගෙන ඇත. 2011 වර්ෂයේ දළ විදුලි උත්පාදනයෙන් 6.3ක් නව පුනර්ජනනීය බලශක්තිය මඟින් ජනනය කර ඇත. ශ්‍රීලසුබඅ ඉහළම ප්‍රතිඵල සහිත පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘති ස්ථාපිත කිරීම සහ පහසුකම් සැපයීම සඳහා ඒවා ස්ථාපිත කල හැකි ප්‍රදේශ හඳුනාගැනීමේ අරමුණින් සම්පත් සිතියම්ගත කිරීම තුලින් ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව පිළිබඳ තොරතුරු එක්රැස් කරමින් සිටී.

විවිධ ක්ෂේත්‍ර තුල සිදුවන බලශක්ති නාස්තිය අඩුකිරීම සහ බලශක්ති සංරක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමේදී බලශක්ති කළමනාකරණය සහ බලශක්ති කාර්යක්ෂමතා සේවාවන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. නියාමන මැදිහත්වීම්, බලශක්ති කාර්යක්ෂමතා සේවාවන්, බලශක්ති සංරක්ෂණය පිළිබඳව දැනුවත්භාවය ඉහළනැංවීම සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ මූල්‍යයන යෝජනාක්‍රම සඳහා පහසුකම් සැපයීම වශයෙන් ශ්‍රීලසුබඅ විසින් ජාතික බලශක්ති කමනාකරණය සඳහා උපායමාර්ගික පියවර හතරක් හඳුනාගෙන ඇත. මෙම ක්‍රියා පිළිවෙල යටතේ, ජාතික බලශක්ති කළමනාකරණ බලකාය සඳහා බලයලත් බලශක්ති කළමනාකරුවන් සහ බලශක්ති විගණකවරුන් එක් කිරීමට ශ්‍රීලසුබඅ සමත් වී ඇත. බලශක්ති සුරක්ෂිතතාව අත්පත් කර ගැනීමේ වඩාත් පිරිවැය-ඵලදායී ක්‍රමවේදයක් වන බව සනාථ කරමින් ඉලක්කගත ක්ෂේත්‍රවල බලශක්ති සංරක්ෂණ සාක්ෂාත් කර ගැනීම් හේතුවෙන් නව විදුලි උත්පාදන එක් කිරීම සඳහා වන අවශ්‍යතාවය අඩු කල හැක.

තිරසාර බලශක්ති මැදිහත්වීම් තුලින් දිවයින සඳහා බලශක්ති සුරක්ෂිත අනාගතයක් සාක්ෂාත් කර ගැනීම ගැනීම සඳහා වෙහෙස නොබලා කටයුතු කරන කළමනාකාර මණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ශ්‍රීලසුබඅ යේ කාර්ය මණ්ඩලය කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. ස්තුතියි.

ආචාර්ය කිත්සිරි දිසානායක

සභාපති

## අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවුඩය



ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (ශ්‍රීලසුබඅ) වාර්ෂික වාර්තාව සඳහා මෙම කෙටි පණිවුඩය මා ගෙන එන්නේ සතුටිනි. 2012 වර්ෂයේදී අධිකාරියෙහි ප්‍රධාන සාක්ෂාත් කර ගැනීම් නැවත සිහි ගැන්වීම සඳහා මම මෙය විශේෂ අවස්ථාවක් කර ගනිමි.

ශ්‍රීලසුබඅ වර්ෂ 2007 ඔක්තෝබර් මස සිදු වූ එහි ආරම්භයේ සිටම විශිෂ්ඨ තිරසාර ක්‍රියාකාරකම් තුලින් බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක් සාක්ෂාත්කර ගැනීම කරා ජාතිය මෙහෙය වමින් සිටි කැප වූ කණ්ඩායමක නොනවතින ප්‍රයත්නයන් තුලින් පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති සංරක්ෂණය සහ සහ කළමනාකරණ ක්ෂේත්‍ර වල සැලකිය යුතු සංවර්ධනයක් අත්පත් කර ගැනීමට අප සමත් වී ඇත. කුඩා ජල විදුලි, සුළං හා ජෛවස්කන්ධ බලාගාර වැනි නව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර හඳුනාගැනීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ විශිෂ්ඨ ප්‍රගතියක් 2012 වර්ෂයේදී ලබා ඇත. ශ්‍රීලසුබඅ මඟින් පවරන ලද නව පුනර්ජනනීය බලශක්ති ප්‍රබව මඟින් ජාතික ජාලය සඳහා 2011 වර්ෂය තුල පමණක් මෙගාවොට් 25.61 ක් සම්බන්ධ කර ඇති අතර ආරම්භයේ සිට ගතහොත් එය මෙගාවොට් 243 ක මුළු ප්‍රමාණයකි. ගෘහස්ථ, කර්මාන්ත සහ වාණිජ ක්ෂේත්‍ර වල ආරම්භ කරන ලද බලශක්ති කාර්යක්ෂමතා වැඩපිළිවෙල තුලින් 2012 වර්ෂයේදී ගි.වො.පැ. 448.3 ක බලශක්ති ඉතිරියක් සාක්ෂාත් කර ගැනීමට ශ්‍රීලසුබඅ සමත් වී ඇත. මෙය 2012 වර්ෂය තුල දී දිවයිනෙහි මුළු බලශක්ති පරිභෝජනයෙන් 4.1% කට සමාන වේ. තවදුරටත් ඉන්ධන මාරු කිරීමේ වැඩසටහන තුළින් ඉන්ධන ලීටර් 715ක, පෙට්‍රෝලියම් වායුව ටොන් 328.7 ක සහ දැව ඉන්ධන 476.3ක සැපකිය යුතු ඉතිරියක් 2012 වර්ෂයේදී අත්පත් කරගෙන ඇත.

බලශක්ති කළමණාකරුවන් සහ බලශක්ති විගණකවරුන් බලගැනිවීමේ නියාමනයන් 2011 වර්ෂයේ ජූලි 20 වැනි දින ගැසට් නිවේදන අංක 1715/12 මඟින් ප්‍රකාශයට පත් කර ඇත. මෙහි ප්‍රධාන අරමුණ වූයේ ක්ෂේත්‍රයේ මුළු බලශක්ති පරිභෝජනයෙන් 80% කට පමණ හේතු වන කර්මාන්ත ක්ෂේත්‍රයේආයතන 1500කට වැඩි ප්‍රමාණයක් සඳහා යෝග්‍ය බලශක්ති කළමණාකරන සැලසුමක් ක්‍රියාවට නැංවීමයි. එමෙන්ම තවත් වැදගත් ක්‍රියාකාරකමක් වූයේ ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා වැඩසටහනක් දියත් කිරීමයි. මොරටුව විශ්ව විද්‍යාලය, හොංකොං බහුතාක්ෂණික විශ්ව විද්‍යාලය සහ ආසියානු නගර සඳහා පිරිසිදු වායු මුලපිරීම් (CAI Asia)මධ්‍යස්ථානයේ සහයෝගය සමඟින් බලශක්ති කාර්යක්ෂමතා සහ පාරිසරික තිරසර ප්‍රවාහනය (E3ST)පිළිබඳ සම්මන්ත්‍රණයක් සහ ධාවන චක්‍ර සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදි. ප්‍රවාහන ක්ෂේත්‍රයේ අදාල සංවිධාන මෙම මුලපිරීම නොකඩවා යොදවා ගනු ඇතැයිද එමඟින් සැලකිය යුතු ප්‍රවාහන ඉන්ධන ඉතිරියක් සමඟින් නාගරික වාතයෙහි ගුණාත්මකභාවය වැඩිදියුණු වනු ඇතැයිද අපේක්ෂා කෙරේ.

අනාගතය දෙස බැලීමේදී බලශක්තිය සඳහා ඉහල යන ගෝලීය ඉල්ලුමට සහ පරිසරයට ඇති ඉහල යන අවධානමට සාපේක්ෂව ශ්‍රීලසුබඅ යේ වගකීම් විශාල වශයෙන් වර්ධනය වේ. තිරසාර සංකල්ප වල සහායෙන් හැකි උපරිම මට්ටමින් සාමාජීය සහ පාරිසරික බැඳියාවක් ආරක්ෂා කර ගනිමින් දිවයිනෙහි ආර්ථික සංවර්ධනය සඳහා බලශක්ති ක්ෂේත්‍රයේ දායකත්වය සහතික කිරීම අපගේ කාර්යභාරය වේ.

ආචාර්ය තුසිත සුගතපාල
අධ්‍යක්ෂ ජනරාල්

## අපගේ දැක්ම

බලශක්ති වලින් සුරක්ෂිත ශ්‍රී ලංකාවක්

## අපගේ මෙහෙවර

ස්වභාවික බලශක්ති සම්පත් සංවර්ධනය කිරීම හා උකහා ගැනීම, පර්යේෂණ පැවැත්වීම හා සංවර්ධනය කිරීම මඟින් බලශක්ති සම්පත් කිරීමෙහිලා ජාතියට මඟ පෙන්වීම සඳහා හැකි උපරිම උත්සහ කිරීම හා ස්භාවික මානව හා ආර්ථික සම්පත් ආරක්ෂා කර ගනිමින් මනා සුනිත්‍ය ක්‍රමවේද අනුගමනය කරමින් ජාතික සංවර්ධන මාවත සාර්ථක කර ගැනීමට දැනුම් කළමනාකරණය කිරීම මඟින් ශ්‍රී ලංකාවෙහි බලශක්ති ආරක්ෂා කර ගැනීම.



## කළමනාකරණ මණ්ඩලය - 2012

සභාපති
ආචාර්ය කිත්සිරි දිසානායක මහතා

සාමාජිකයන්

එම්. එම්. සී.ප්‍රදිනාන්දු මහතා
ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

ආචාර්ය වයි. ඩී. නිහාල් ජයතිලක මහතා
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය

එම්. ඒ. තාජුඩීන් මහතා
අධ්‍යක්ෂ (සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය)
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

තනුජා මුරුගේසම් මිය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඉඩම්)
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

විමල් ජයවර්ධන මහතා
අතිරේක ලේකම් (පාලන)
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග මහතා
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

පී. යූ. වික්‍රමරත්න මහතා (ඉංජිනේරු)
අතිරේක ලේකම් (තාක්ෂණික)
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ
අමාත්‍යාංශය

ඒ. එම්. ඩබ්. සරත්චන්ද්‍ර මහතා
අධ්‍යක්ෂ (සැලසුම් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම)
ප්‍රවාහන අමාත්‍යාංශය

එස්. එස්. මුදලිගේ මහතා
අධ්‍යක්ෂ (ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
ධාරා විජයතිලක මහත්මිය
ලේකම්
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

දමිත කුමාරසිංහ මහතා
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව

ඩී. චන්ද්‍රෙස්කර මහතා
ශ්‍රී ලංකා බලශක්ති කළමණාකරුවන්ගේ සංගමය

ක්‍රිශාන් නානායක්කාර මහතා
ප්‍රධාන විධායක නිලධාරී
ගිද්දාව හයිඩ්‍රෝ පවර් (පුද්) සමාගම

එල්. පී. ජයසිංහ මහතා
වාණිජ මණ්ඩලය

කේ. ඒ. බන්දුල චන්ද්‍රසේකර මහතා
අධ්‍යක්ෂ
බලශක්ති සංසදය

සුරන්ජන් කොඩිතුවක්කු මහතා

චමත් ඩී සිල්වා මහතා

අසෝක අබේගුණවර්ධන මහතා
විධායක අධ්‍යක්ෂ
බලශක්ති සංසදය

## විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයන් - 2012

**සභාපති**

**එස්. එස්. මුදලිගේ මහතා**

**අධ්‍යක්ෂ (ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව)**

**මුදල් හා කුම සම්පාදන දෙපාර්තමේන්තුව**

**<u>සාමාජිකයන්</u>**

**ඩී. චන්ද්‍රසේකර මහතා**

**ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය**

**සුලක්ෂණ ජයවර්ධන මහතා**

**සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා සංවර්ධන නිරීක්ෂණ)**

**විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය**


**ආර්. එම්. රත්නායක මහතා**

**විගණන අධිකාරි**

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**

# අපගේ සේවක මඩුල්ල - 2012

**අපගේ සමස්ථ කාර්ය මණ්ඩලය 89ක් වන අතර එහි සංයුතිය පහත දක්වා ඇත.**



## හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ වර්ෂ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතෙහි නියෝග ප්‍රකාරව වර්ෂ 2007 ඔක්තෝබර් මස 01 වැනි දින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය(SEA) පිහිටුවන ලදී. දේශීය බලශක්තිය ඉහළ නැංවීමෙන් සහ රට තුල බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම තුලින් බලශක්ති උත්පාදනය සහ භාවිතය පිළිබඳ තිරසාරභාවයෙහි නව මට්ටමක් කරා ශ්‍රී ලංකාව මෙහෙයවීම සඳහා ප්‍රධාන ආයතනයක අවශ්‍යතාවය සපුරාලීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිහිටුවන ලදී. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ක්‍රියාකාරකම් වැඩසටහන බලශක්ති සුරක්ෂිතතාවය, පාරිසරික තිරසාරභාවය සහ සමාජ-ආර්ථික සංවර්ධනය ඇතුලත් වන ජාතික සංවර්ධන අභිමථාර්තයන් සාක්ෂාත් කර ගැනීමෙහිලා දායකත්වයක් ලබා දෙනු ඇති බව අපේක්ෂා කෙරේ.

වර්ෂ 2012-2015 සංයුක්ත සැලසුමට අනුව, 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ක්‍රියාකාරකම් ප්‍රධාන අංශ දෙකක් එනම් පුනර්ජනනීය බලශක්ති (RE) සහ බලශක්ති කළමනාකරණ (EM) ඔස්සේ සිදු කරගෙන ගොස් ඇත. පුනර්ජනනීය බලශක්ති සම්පත් පරිභෝජනය ප්‍රවර්ධනය කිරීමේ බලය RE අංශය සතුවද දිවයිනෙහි ආර්ථික සංවර්ධනයේ බලශක්ති තීව්‍රතාවය කළමනාකරණය කිරීමේ බලය EM අංශය සතුවද පවතින අතර ප්‍රතිපත්ති සහ මෙහෙයුම් මට්ටම් වලින් අංශ දෙක අතර මැදිහත්වීම් සම්පාදනය කෙරේ. 2012 වර්ෂය තුලදී, RE සහ EM අංශයන්හි උත්පාදනය කරන ලද දැනුම ව්‍යාප්ත කිරීම සහ විධිමත්, අවිධිමත් සහ නොවිධිමත් අධ්‍යාපන මාර්ග ඔස්සේ සුනිත්‍ය බලශක්තිය පිළිබඳව දැනුවත් වූ ජාතියක් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අරමුණු සමඟින් දැනුම් කළමනාකරණ (KM) ක්ෂේත්‍රය සවිබලගැන්වීම සඳහා මුලපිරීම් සිදු කර ඇත.

3012 වර්ෂ අවසානය වන විට නව පුනර්ජනනීය බලශක්ති සම්පත් (NRE) වල මුළු පිහිටුම් ධාරිතාවය මෙ.වො. 312 ක් කර ලඟා වූ අතර ජාල විදුලිබල උත්පාදනයට 6.2% ක දායකත්වයක් ලබා දෙමින් ගි.වො.පැ. 736 ක් උත්පාදනය කරන ලදී. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් 2012 වර්ෂය තුලදී බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණුකිරීම් සහ සංරක්ෂණ ක්‍රියාකාරකම් වලින් කර්මාන්ත සහ වාණිජ අංශ තුල පමණක් සිදු කරන ලද වාර්ෂික විදුලිබල ඉතිරිකිරීම් වල ප්‍රමාණය මෙ.වො.පැ. 37 ක් වන අතර පසුගිය වර්ෂ වල සිදු කරන ලද මැදිහත්වීම් වලින් සිදු කරනු ලැබූ මෙ.වො.පැ. 300 කට වඩා වැඩි වාර්ෂික ඉතිරිකිරීම් වලින් දිවයින ප්‍රතිලාභ ලබමින් පැවතිණි. තවදුරටත්, කර්මාන්ත තාප භාවිතය පොසිල ඉන්ධනවල සිට ජෛව ස්කන්ධ කරා ඉන්ධන මාරු කිරීම තුලින් දිවයිනෙහි බලශක්ති සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

## අපගේ අරමුණු

පනතෙහි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රධාන අරමුණු වන්නේ:

(අ) බලශක්ති සුරක්ෂිතතාව ඉහළ නැංවීමෙන් සහ එමගින් දිවයිනට ආර්ථික සහ සමාජීය ප්‍රතිලාභ අත්පත් කර දීමේ අරමුණින් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර හඳුනා ගැනීම, ප්‍රවේශය සහ සංවර්ධනය;

(ආ) ගෘහස්ථ, වාණිජ, කෘෂිකාර්මික, ප්‍රවාහන, කර්මාන්ත සහ ඕනෑම වෙනත් අදාළ ක්ෂේත්‍රයක බලශක්ති භාවිතය සඳහා බලශක්ති ඵලදායීතාවය වැඩිදියුණු කිරීමේ සහ බලශක්ති සංරක්ෂණය කිරීමේ වැඩසටහන් හඳුනාගැනීම, ප්‍රවර්ධනය, පහසුකම් සැපයීම, ක්‍රියාවට නැංවීම සහ කළමනාකරණය කිරීම;

(ඇ) ප්‍රතිපත්ති සංවර්ධනය සහ විශ්ලේෂණය සහ සම්බන්ධිත තොරතුරු කළමනාකරණය කිරීම මඟින් දිවයිනට බලශක්තිය සැපයීමේ ආරක්ෂාව, විශ්වසනීයත්වය සහ පිරිවැය ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම; සහ

(ඈ) බලශක්තියෙහි අවම ආර්ථික පිරිවැය සහ ජාතිය සඳහා බලශක්ති සුරක්ෂිතතාවය සමඟ අනුරූප වෙමින් අධිකාරියට එහි ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රමාණවත් අරමුදල් පැවතීම සහතික කිරීම.

තවද, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ක්‍රියාකාරකම් විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය අරමුණු කිහිපයක් ශ්‍රී ලංකා ජාතික බලශක්ති ප්‍රතිපත්ති සහ උපායමාර්ගයන්හි බලශක්ති ප්‍රතිපත්ති මූලිකාංග වල දක්වා ඇත, එනම්:

- මූලික බලශක්ති අවශ්‍යතා සැපයීම
- බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම
- බලශක්ති කාර්යක්ෂමතාවය සහ සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම
- දේශීය සම්පත් ප්‍රවර්ධනය කිරීම
- බලශක්ති පහසුකම් වල හානිකර පාරිසරික බලපෑම් වලින් ආරක්ෂා කිරීම

මේවා අතර, බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම,දේශීය බලශක්තිය ඉහළ නැංවීම සහ බලශක්ති කාර්යක්ෂමතා ශ්‍රේණිය (rank) අපගේ ප්‍රමුඛතා අතර ඉහළින්ම පවතී.

## අපගේ ඉලක්කයන්

ඉහත අරමුණු කර ලඟා වීමේදී, RE, EM සහ KM ක්ෂේත්‍රයන්හි මැදිහත්වීම් තුලින් ඉලක්ක කිහිපයක් පිහිටුවා ගෙන ඇත. සියළු අංශයන්හි විදුලි සහ තාප බලශක්ති සේවාවන් ඉලක්ක කර ගනිමින් RE සම්පත් සංවර්ධනය කිරීම, බලශක්ති සම්පත් විවිධාංගීකරණය කිරීම සහ බලශක්ති සංකලනය යුක්තියුක්ත කිරීම තුලින් දිවයිනෙහි බලශක්ති සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා සහ පිරිසිදු බලශක්ති සම්පත් සහ තාක්ෂණික ක්‍රමවේද කරා මාරු වීම තුලින් පාරිසරික තිරසාරභාවය අත්පත් කර ගැනීම සඳහා ද දායක වන බව අපේක්ෂා කෙරේ. ඒ අනුව, RE සංවර්ධනයෙහි පහත ඉලක්ක පිහිටුවා ඇත:

(i) වර්ෂ 2017 වන විට සියළු පුරවැසියන් සඳහා නවීන බලශක්ති සේවාවන් සඳහා ප්‍රවේශය ලබාදීම.

(ii) වර්ෂ 2015 වන විට ජාල විදුලියෙන් 10% ක් NRE සම්පත් තුලින් උත්පාදනය කිරීම.

(iii) කර්මාන්ත තාප බලශක්තියෙන් 10% ක් ජෛවස්කන්ධ වලින් ලබා ගැනීම.

(iv) පිරිසිදු පිසන ඉන්ධනයක් ලෙස ජෛවස්කන්ධ භාවිතය 10% කින් ඉහළ නැංවීම.

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන අභිමතාර්ථයන් නිවැරදි එල්ලයේ තබා ගැනීම සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ ශක්තිමත් වර්ධනයක් අපේක්ෂා කිරීම ආර්ථිකයේ වර්තමාන බලශක්ති තීව්‍රතා මට්ටම් රඳාපවත්වා ගනිමින් සිදු කල නොහැක. ආර්ථිකයේ බලශක්ති තීව්‍රතාවය වැඩි කිරීම ආනයනය කරන ලද පොසිල ඉන්ධන මත අධික ලෙස රඳාපැවතීම හේතුවෙන් දිවයිනෙහි ආර්ථික සංවර්ධනය අවහිර කරනු ඇත. එබැවින්, පහත සඳහන් ක්‍රියාමාර්ග තුලින් වර්ෂ 2017 වන විට මිලියන 500 toe/XDR ක ආර්ථිකයේ බලශක්ති තීව්‍රතාවයක් ඉලක්ක කර ගනිමින් බලශක්ති වර්ධනයෙන් ආර්ථික සංවර්ධනය වෙන් කිරීම සඳහා පිළියම් යොදනු ඇත.

- ✓ බලශක්ති කළමනාකරණ පද්ධති පිහිටුවීම සහ බලශක්ති කාර්යක්ෂමතා සේවාවන් ලබාදීම සඳහා සම්පූර්ණ ක්‍රමවේදයක්
- ✓ පුළුල් ධාරිතා සංවර්ධන වැඩසටහනක්
- ✓ බලශක්තිය පිළිබඳ දැනුවත් ජාතියක් ප්‍රත්ෂ්ඨාපනය කිරීම සඳහා විස්තීර්ණ දැනුවත්කිරීමේ සහ අධ්‍යාපනික වැඩසටහනක්.


ඉහත මහපෙන්වීමෙහි විශේෂිත ඉලක්කය වන්නේ

- ✓ වර්ෂ 2020 වන විට විදුලිබල ඉල්ලුමෙන් 8.7% ක් (2010 වර්ෂයේ විදුලිබල ඉල්ලුමෙන් 20% ක් හා සමාන වන) ඉතිරි කිරීම.

# අපගේ බලපෑම

## ආර්ථිකය


**2007** වර්ෂයේ සිට NRE කර්මාන්තයේ අපගේ ක්‍රියාකාරී පහසුකම් සැපයීම මඟින් පොසිල ඉන්ධන ආනයනය වැළැක්වීම තුලින් රුපියල් බිලියන **52** කට වඩා වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් රටට ඉතිරි කර දී ඇත.




**1** රූපය: විදේශ විනිමය ඉතිරි කිරීම

## පිරිසිදු බලශක්තිය

නව පුනර්ජනනීය බලශක්ති කර්මාන්තය සඳහා අපගේ ක්‍රියාකාරී දායකත්වය හේතුවෙන් **2012** වර්ෂයේදී පිරිසිදු බලශක්තිය ගිවොපැ **700** ක් රටට දයාද කොට ඇත.




**2** රූපය: NRE සම්පත් වලින් උත්පාදනය කරන ජාල විදුලිය

තවද, 2012 වර්ෂයේදී පමණක් අප විසින් සිදු කරන ලද  බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාකාරකම් වලින් කර්මාන්ත සහ වාණිජ අංශ තුල සිදු කරනු ලැබූ විදුලිබල ඉතිරිකිරීම් වල ප්‍රමාණය ගිවොපැ 37 ක් වන අතර එය පසුගිය වර්ෂ වල සිදු කරන ලද මැදිහත්වීම් වලින් ඉතිරි කරනු ලැබූ මෙවොපැ. 300 ට වඩා වැඩි ඉතිරිකිරීම් ප්‍රමාණයට අමතර වශයෙන් වේ. එයට අමතරව, නවීන ජෛවස්කන්ධ බලශක්ති තාක්ෂණයන් ව්‍යාප්ත කිරීම තුලින් ඉන්ධන මාරු කිරීම හරහා ඩීසල් ලීටර් මි. 8.7 ක් පමණ සහ දැවි තෙල් ලීටර් මි. 0.6 ක් පමණ ඉතිරි කර ඇත.


## කර්මාන්ත

ආයතනයන්හි බලශක්ති කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ශක්තිමත් උපදේශකත්වය හේතුවෙන් එක් ආයතනයක් ජාතික බලශක්ති කාර්යක්ෂමතා ස්වර්ණ සම්මානයෙන්ද ආයතන හතරක් රජත සම්මානයෙන්ද ආයතන දෙකක් ලෝකඩ සම්මානයෙන්ද පිදුම් ලැබීය.

# බලශක්ති අංශ සමාලෝචනය

## Primary Energy Supply by Source


| බලශක්ති සම්පත | ප්‍රාථමික බලශක්තිය (PJ) | |
|---|---|---|
| | 2011 | 2012 |
| ජෛවස්කන්ධ | 207.0 | 235.9 |
| ඛණිජතෙල් | 205.8 | 218.5 |
| ගල්අඟුරු | 13.6 | 19.1 |
| ප්‍රධාන ජලවිදුලි | 40.4 | 27.4 |
| නව පුනර්ජනනීය බලශක්ති | 7.5 | 7.6 |
| එකතුව | **474.2** | **508.4** |




2012 වර්ෂයේදී සම්පත් අනුව ප්‍රාථමික බලශක්ති සැපයුම

### සම්පත් අනුව බලශක්ති ඉල්ලුම


| බලශක්ති සම්පත | බලශක්ති ඉල්ලුම (PJ) | |
|---|---|---|
| | 2011 | 2012 |
| ජෛවස්කන්ධ | 206.1 | 235.3 |
| ඛණිජතෙල් | 128.5 | 139.0 |
| ගල්අඟුරු | 3.1 | 2.6 |
| විදුලිය | 36.0 | 37.5 |
| එකතුව | **373.7** | **414.4** |




2012 වර්ෂයේදී සම්පත් අනුව බලශක්ති ඉල්ලුම

## අංශය අනුව බලශක්ති ඉල්ලුම


| බලශක්ති අංශය | බලශක්ති ඉල්ලුම (PJ) | |
|---|---|---|
| | 2011 | 2012 |
| කර්මාන්ත | 91.1 | 95.1 |
| ප්‍රවාහන | 103.0 | 111.8 |
| ගෘහස්ථ සහ වාණිජ | 79.4 | 207.3 |
| කෘෂිකර්ම | 0.3 | 0.1 |
| එකතුව | **373.8** | **414.3** |




2012 වර්ෂයේදී අංශය අනුව බලශක්ති ඉල්ලුම

## සම්පත් අනුව කර්මාන්තයන්හි බලශක්ති ඉල්ලුම


| බලශක්ති සම්පත | බලශක්ති ඉල්ලුම (PJ) | |
|---|---|---|
| | 2011 | 2012 |
| ජෛවස්කන්ධ | 66.3 | 68.3 |
| ඛණිජතෙල් | 10.5 | 11.5 |
| ගල්අඟුරු | 2.1 | 2.6 |
| විදුලිය | 12.2 | 12.7 |
| එකතුව | **91.1** | **95.1** |




2012 වර්ෂයේදී සම්පත් අනුව කර්මාන්තයන්හි බලශක්ති

## ගෘහස්ථ, වාණිජ සහ වෙනත් අංශයන්හි සම්පත් අනුව බලශක්ති ඉල්ලුම


| බලශක්ති සම්පත | බලශක්ති ඉල්ලුම (PJ) | |
|---|---|---|
| | 2011 | 2012 |
| ජෛවස්කන්ධ | 139.9 | 166.9 |
| ඛණිජතෙල් | 15.7 | 15.6 |
| විදුලිය | 23.8 | 24.8 |
| එකතුව | **179.4** | **207.3** |




2012 වර්ෂයේදී ගෘහස්ථ, වාණිජ සහ වෙනත් අංශයන්හි සම්පත් අනුව බලශක්ති ඉල්ලුම

## සම්පත් අනුව ප්‍රවාහනයෙහි බලශක්ති ඉල්ලුම

| බලශක්ති සම්පත | බලශක්ති ඉල්ලුම (PJ) | |
|---|---|---|
| | 2011 | 2012 |
| ඛණිජතෙල් | 101.9 | 111.8 |
| ගල්අඟුරු | 1.1 | - |
| එකතුව | **103.0** | **111.8** |




2012 වර්ෂයේදී සම්පත් අනුව ප්‍රවාහනයෙහි බලශක්ති ඉල්ලුම

## පොසිල ඉන්ධන අංශය

| නිෂ්පාදනය | ආනයන (kt) | |
|---|---|---|
| | 2011 | 2012 |
| බොර තෙල් | **1,931.9** | **1,626.1** |
| නිමි භාණ්ඩ | **2,824.3** | **3,376.8** |
| LP ගෑස් | 181.3 | 192.6 |
| පෙට්‍රල් | 508.5 | 574.6 |
| Avtur | 244.1 | 288.2 |
| මෝටර් රථ ඩීසල් | 1,402.0 | 1,652.2 |
| ඉන්ධන තෙල් | 367.9 | 563.7 |
| Avgas | 0.2 | 0.2 |
| තාර | 120.3 | 105.3 |
| ගල් අඟුරු | **760.2** | **962.4** |

| නිෂ්පාදනය | පිරිපහදු නිෂ්පාදන (kt) | |
|---|---|---|
| | 2011 | 2012 |
| බොර තෙල් | **2,003.6** | **1,596.1** |
| නැප්තා එකතුව | 80.0 | 70.9 |
| පෙට්රල් එකතුව | 206.5 | 151.6 |
| Avtur | 155.4 | 93.2 |
| භූමිතෙල් | 92.9 | 74.8 |
| ඩීසල් එකතුව | 501.1 | 394.2 |
| දැවි තෙල් එකතුව | 614.6 | 648.4 |
| ද්‍රාවක එකතුව | 3.8 | 3.8 |
| තාර | 46.1 | 46.1 |
| මුළු ප්‍රතිදානය | **1,724.4** | **1,480.7** |

## විදුලිබල අංශය

| සම්පත | ජාල ධාරිතාවය (මෙවො) | |
|---|---|---|
| | 2011 | 2012 |
| ප්‍රධාන ජලවිදුලි | 1,207.5 | 1,357.5 |
| තාප බලය | 1,689.5 | 1,695.3 |
| NRE සහCEB සුළං | 243.7 | 315.2 |
| එකතුව | **3,140.7** | **3,368.0** |

| විදුලිබල ඉල්ලුම (ගිවොපැ) | | |
|---|---|---|
| නිෂ්පාදනය | 2011 | 2012 |
| ගෘහස්ථ | 3,928.4 | 4,062.9 |
| ආගමික | 59.1 | 63.3 |
| කර්මාන්ත | 3,379.3 | 3,528.0 |
| වාණිජ | 2,490.2 | 2,614.1 |
| වීථි ආලෝකකරණය | 132.9 | 139.1 |
| එකතුව | **9,989.9** | **10,407.4** |

| සම්පත | දළ උත්පාදනය (ගිවොපැ) | |
|---|---|---|
| | 2011 | 2012 |
| ප්‍රධාන ජලවිදුලි | 4,017.7 | 2,726.7 |
| තාප (තෙල්) | 5,857.5 | 7,012.7 |
| තාප (ගල්අඟුරු) | 1,038.1 | 1,403.7 |
| CEB සුළං | 2.7 | 2.3 |
| NRE | 722.3 | 733.3 |
| එකතුව | **11,638.2** | **11,878.8** |

| ජාල විමෝචන සාධක (t-CO2/MWh) | | |
|---|---|---|
| පදනම | 2011 | 2012 |
| සරල මෙමෙහෙයුම් සීමාව | 0.7046 | 0.7035 |
| ගොඩනැගූ සීමාව | 0.7670 | 0.7665 |
| ඒකාබද්ධ සීමාව | 0.7202 | 0.7193 |

## ආර්ථික දර්ශක

| දර්ශකය | 2011 | 2012 |
|---|---|---|
| 1982 සාධක පිරිවැය මිළගණන් අනුව GDP (රු.මි.) | 382,520 | 403,558 |
| වාණිජ බලශක්ති තීව්‍රතාවය (TJ/LKR million) | 0.44 | 0.47 |
| විදුලි මිළගණන් වල මධ්‍යයනය (LKR/kWh) | 13.63 | 15.71 |
| විකුණූ විදුලිය (kWh/person) | 478.7 | 511.1 |
| ශුද්ධ ඉන්ධන ආනයනය පෙට්රෝලියම් නොවන අපනයන වල % ලෙස | 44.2 | 51.5 |



# කාර්ය සාධනය

# 2012

## නව පුනනර්ජනනීය බලශක්ති සංවර්ධනය

### පුනර්ජනනීය බලශක්ති සම්පත් සංරක්ෂණය සහ කළමනාකරණය


**ශ්‍රී ලංකා ජාතික බලශක්ති ප්‍රතිපත්ති සහ උපාය මාර්ග වල දක්වා ඇති පරිදි උපාය මාර්ගයන්ට අනුව වර්ෂ 2015 වනවිට නව පුනර්ජනනීය බලශක්ති (NRE) වලින් 10% ක විදුලිබල උත්පාදනයක් අත්පත් කර ගැනීමේ අරමුණ පෙරදැරි කර ගනිමින් දිවයිනෙහි පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සිදු කරනු ලබන අතර මෙම අභිමතාර්ථය ශ්‍රී ලංකා රජයේ සංවර්ධන ප්‍රතිපත්තිමය රාමුව වන මහින්ද චින්තන-අනාගත දැක්ම අනුව වර්ෂ 2020 වන විට 20% ක් දක්වා ඉහළ නංවනු ඇත.**

**2099.04.27 දිනැති අංක 1599/6 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධියට පත් කරන ලද 2009 ජාලගත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති නියාමනයන් 2011.05.10 දිනැති අංක 1705/22 දරන ගැසට් පත්‍රය මඟින් අවලංගු කරන ලදී. ජාලගත පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සංස්කරණය V2.0/2011 සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා මාර්ගෝපදේශයක් ද නියාමනයන් මඟින් හඳුන්වා දී ඇත. මෙම මාර්ගෝපදේශය මඟින් පවතින පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආයෝජකයින් සහ මෙහෙයුම්කරුවන් හට, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියෙහි යෙදී සිටින ආයෝජකයින් සහ එවැනි ව්‍යාපෘති සංවර්ධනය කිරීමෙහි සහ ඒවායේ ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයින් හට තොරතුරු ලබා දෙනු ලැබේ. යම්කිසි සම්පතක් සඳහා අනාගත ව්‍යාපෘති සංවර්ධකයින් හට සම්පූර්ණ අයදුම්කිරීමක් සිදු කල හැකි වන අයුරින් සකස් කරන ලද අවශ්‍ය සියළු දේ සහිත ලේඛන කට්ටලයක් සකස් කර නොමිලේ ලබා ගැනීම සඳහා තබා ඇත. ප්‍රාමාණික බලශක්ති මිලදීගැනීමේ ගිවිසුම් (SPPA) යෝජනාක්‍රමය යටතේ සළකා බලන ලද සියළු සම්පත් වර්ග ලේඛන කට්ටලය මඟින් ආවරණය වේ.**



3 රූපය: ජාලගත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය සඳහා ප්‍රාමාණික අයදුම්පත් කට්ටලය

## පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලසුම




| No | District | Biomass | Solar | Wind | Hydro | Total |
|---|---|---|---|---|---|---|
| 1 | Ampara | 30 | 0 | 0 | 0 | 30 |
| 2 | Anuradhapura | 15 | 30 | 0 | 2 | 47 |
| 3 | Badulla | 15 | 0 | 60 | 61 | 136 |
| 4 | Batticaloa | 15 | 0 | 0 | 0 | 15 |
| 5 | Colombo | 40 | 0 | 0 | 0 | 40 |
| 6 | Galle | 15 | 0 | 0 | 12 | 27 |
| 7 | Gampha | 5 | 0 | 0 | 0 | 5 |
| 8 | Hambantota | 15 | 100 | 60 | 1 | 176 |
| 9 | Jaffna | 0 | 0 | 100 | 0 | 100 |
| 10 | Kalutara | 30 | 0 | 0 | 3 | 33 |
| 11 | Kandy | 15 | 0 | 30 | 80 | 125 |
| 12 | Kegalle | 0 | 0 | 0 | 94 | 94 |
| 13 | Kilinochchi | 15 | 30 | 60 | 0 | 105 |
| 14 | Kurunegala | 30 | 30 | 0 | 0 | 60 |
| 15 | Mannar | 0 | 0 | 260 | 0 | 260 |
| 16 | Matale | 0 | 0 | 30 | 38 | 68 |
| 17 | Matara | 15 | 0 | 0 | 13 | 28 |
| 18 | Monaragala | 30 | 15 | 0 | 6 | 51 |
| 19 | Mullaittivu | 15 | 0 | 30 | 0 | 45 |
| 20 | Nuwara Eliya | 0 | 0 | 60 | 133 | 193 |
| 21 | Polonnaruwa | 15 | 30 | 0 | 8 | 53 |
| 22 | Puttalam | 15 | 0 | 260 | 0 | 275 |
| 23 | Ratnapura | 0 | 0 | 30 | 151 | 181 |
| 24 | Trincomalee | 15 | 0 | 30 | 0 | 45 |
| 25 | Vavuniya | 15 | 15 | 0 | 0 | 30 |
| | Total | 360 | 250 | 1010 | 602 | 2222 |

4 රූපය: මධ්‍ය කාල සංවර්ධනයන් සඳහා NRE සම්පත් ඉන්වෙන්ට්‍රිය

පනතෙහි ඡේද අංක 7 හි අවශ්‍යතාවය පරිදි පුනර්ජනනීය බලශක්ති සම්පත් පිළිබඳ විස්තීර්ණ සමීක්ෂණයක් (කුඩා ජල විදුලි, සුළං, සූර්ය සහ ජෛවස්කන්ධ ආවරණය කරමින්) සහ පුනර්ජනනීය සම්පත් ඇගයීම් අධ්‍යයනයක් දිවයින තුල සිදු කරමින් පවතී. වෙබ් පදනම් භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) භාවිතා කරමින් පුනර්ජනනීය බලශක්ති සම්පත් ඉන්වෙන්ටරියක් සකස් කිරීම සඳහා මෙම අධ්‍යයන දායකත්වය ලබා දී ඇත. ඉහත 4 රූපයෙන් මධ්‍ය කාලීන සංවර්ධනය සඳහා දිස්ත්‍රික්ක අනුව පුනර්ජනනීය බලශක්ති සම්පත් ඉන්වෙන්ටරිය පෙන්නුම් කෙරේ.

සුළං: 2012 වර්ෂයේදී, සුළං දැක්වීමේ ස්ථාන ජාලය තවදුරටත් උත්ශ්‍රේණිගත කර ඇත. මේ වන විට ස්ථාන 10 ක් ක්‍රියාකාරීව පවතී. මන්නාරම් දූපතේ සහ යාපනය කලාපයේ පිළිවෙලින් සුළං සහ සූර්ය සම්පත් ඇගයීම් සිදු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් ජර්මනියේ GEO-NET Umwelt කන්සල්ටින් GmbH (GEO-NET) සමාගම සමඟ සහයෝගීව කටයුතු කරන රිසෝස් මැනේජ්මන්ට් ඇසෝසියේට්ස් (පෞද්.) සමාගම වෙත කොන්ත්‍රාත්තුවක් ලබා දී ඇත. ශ්‍රී ලංකා රජයට පිරිනමන ලද TA – 7837 SRI: පිරිසුදු බලශක්තිය සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි (43576 – 012) දෙවැනි කොටස මෙම ඇගයීමට අඩංගු වන අතර ඇගයීම සිදු කරගෙන යෑමේ නිවේදනය 2011 වර්ෂයේ දෙසැම්බර් මස නිකුත් කර ඇත. මෙම ඇගයීම යටතේ, 2012 වර්ෂයේ මැයි මස 30 වැනි දින මීටර් 80 ක් උසැති සුළං කුළුණක් නාඩුකුඩා හීදී කොමිෂන් කරන ලදී. මෙය වර්තමානයේදී දිවයිනෙහි පවතින උසම සුළං කුළුණ වේ. තවදුරටත්, අධ්‍යයන මඟින් පවතින ඉහළ-වායු සහ පෘෂ්ඨික සුළං දත්ත සමාලෝචනය, මූලික සුළං ක්ෂේත්‍ර ආකර්ශනය සම්පූර්ණ කරන ලදී. සුළං කුළුණු පිහිටුවීම සහ කොමිෂන් කිරීම සහ සුළං සම්පත් ඇගයීමේ මූලිකාංග පිළිබඳව SEA ඉංජිනේරුවරුන් පුහුණු කිරීමද මෙම වැඩසටහනට ඇතුලත් විය. ඇගයීම සම්පූර්ණ කල විට, SEA (මෙම ඇගයීමෙහි ක්‍රියාවට නැංවීමේ නියෝජිතායතනය ලෙස) සතුව මන්නාරම් සහ යාපන කලාපයන්හි පිළිවෙලින් විශ්වාසනීය සුළං සහ සූර්ය සම්පත් දත්ත පිළිබඳ දීර්ඝ කාලීන දත්ත සමුදායක් පවතිනු ඇති බව අපේක්ෂා කෙරේ.

අන්තර්ජාතික සම්මතයන් සමඟ අනුකූල වන උසස් තත්ත්වයේ සුළං සහ සූර්ය මැනීම් උත්පාදනය කිරීම සඳහා උත්සාහ කල යුතු වන බව SEA විසින් හඳුනාගෙන ඇත. විශාල පරිමාණයේ සුළං සහ සූර්ය ව්‍යාපෘති පිළිබඳ පිළිගත හැකි ශක්‍යතා අධ්‍යයන සඳහා දීර්ඝ කාලීන දත්ත අවශ්‍ය වන බැවින්, විශ්වාසනීය දීර්ඝ කාලීන සුළං සහ සූර්ය දත්ත සමුදායක් (database) සකස් කිරීමේ සඳහා වන අවශ්‍යතාවයද හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකනු ලැබේ.



5 රූපය: නාඩුකුඩා හි මීටර් 80 ක් උසැති සුළං කුළුණ ස්ථාපිත කිරීම

හම්බන්තොට කලාපයෙහි ඍතුමය වෙනස්වීම් සහ ඉහළ විභේදනයක් සහිත සුළං සිතියමක් සකස් කිරීම සඳහා ඉහළ විභවයක් සහිත සුළං ප්‍රදේශ සඳහා SEA විසින් සුළං කුළුණු පිහිටුවීමට වඩාත් සුදුසු ස්ථාන සෙවීම (micro-siting) සිදු කරමින් සිටී. "ආයෝජනයට සූදානම්" තත්ත්වයට සම්පත් ඔසවා තබමින් ආයෝජන තත්ත්වයේ සුළං සම්පත් සිතියම්, ව්‍යාපෘති ආර්ථික විශ්ලේෂණයකින් සමන්විත වනු ඇත. WAsP මෘදුකාංගය භාවිතා කරමින් මන්නාරම් කලාපය සඳහා සකස් කරන ලද ඉහළ විභේදනයක් සහිත සුළං සිතියම් දිවයිනෙහි පළමු සුළං බලශක්ති උද්‍යානයෙහි පෙර-ශක්‍යතා වාර්තාව සකස් කිරීම සඳහා භාවිතා කරන ලදී. WAsP ආකෘතිය යම් විශේෂිත ස්ථානයකින් (සුළං මැනිමේ කුළුණ) සුළං සම්පත් දත්ත විශ්ලේෂණය කරනු ලබන අතර මතුපිට රළුභාවය, භූලක්ෂණ, බාධක සහ වායුගෝලීය ස්ථායීතාවය වැනි ස්ථානීය තත්ත්ව සඳහා නිවැරදි කිරීම් මඟින් සුළං සම්පත් ලක්ෂණ ඇස්තමේන්තු කරනු ලැබේ. පෙර-ශක්‍යතා වාර්තාව කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

ජල: ඉහළ සහ මධ්‍යම උසකින් පිහිටි සම්පත් සම්බන්ධයෙන් දිවයිනෙහි සංවර්ධනය කල හැකි ජලවිදුලි විභවය අවකාශමය සන්දර්භයක් තුල හඳුනාගෙන ඇත. මෙම අවකාශමය දත්ත ප්‍රශස්ථ ජාල අන්තර්සම්බන්ධතා උපායමාර්ගයක් සඳහා මේ වන විට විශ්ලේෂණය කරමින් පවතී. මිනිසා විසින් තනන ලද ජලය ගෙනයන ව්‍යුහ වල විභවය ඇතුළුව පහත් උසකින් පිහිටි සම්පත් සඳහා වඩාත් භූමිය පදනම් වූ ප්‍රවේශයක් අවශ්‍ය වේ.

ජෛවස්කන්ධ: පවතින භූමි භාවිතය පිළිබඳ දත්ත පදනම් කරගත් ජෛවස්කන්ධ සම්පත් වල සවිස්තර විශ්ලේෂණයක් ආරම්භ කර ඇත. රත්නපුර දිස්ත්‍රික්කයේ සම්පත් විභවය පිළිබඳ ඇගයීම අවසන් වීමට ආසන්න ව පවතී. උනන්දුවක් දක්වන පාර්ශව වල උපදේශනයෙන් පසුව ශෝධිත මෙම ප්‍රවේශය සහ භූමි සමීක්ෂණය මුළු දිවයිනම ආවරණය වන පරිදි පුළුල් කරනු ඇත. ජපාන තාක්ෂණ සහයෝගීතා වැඩසටහන යටතේ විශේෂඥයෙකු විසින් ජෛවස්කන්ධ සම්පත් ඇගයීමේ ජාතික ක්‍රමවේදයක් සම්පාදනය කර ඇත.

සූර්ය: පවතින සූර්ය දත්ත තවදුරටත් ශෝධනය කිරිම සඳහා සිදු කරන ලද මුලපිරීම් මඟින් 2013 වර්ෂය තුල පෙර-ශක්‍යතා මට්ටමේ ඇගයීම් සඳහා සුදුසු වන ඉහළ විභේදනයක් සහිත සූර්ය සිතියමක් ලබා දෙනු ඇත. හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානයෙහි ස්ථානගත කර ඇති මිනුම් ස්ථානයෙන් උත්පාදනය කරන ලද උසස් තත්ත්වයේ සූර්ය සම්පත් දත්ත සූර්ය බලශක්ති සංවර්ධන ප්‍රයත්නයන් සඳහා නව දැනුම එක් කිරීම සිදු කරගෙන ගොස් ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහයෝගිතා වැඩසටහනක් යටතේ මිලදී ගන්නා ලද උසස් තත්ත්වයේ සූර්ය සම්පත් මිනුම් උපකරණ භාවිතා කිරිමෙන් මෙය යාපනය කලාපයේ නැවත සිදු කරනු ඇත. 2012 වර්ෂයේදී හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානය නැරඹීම සඳහා 900 කට වඩා වැඩි පිරිසක් සහභාගී වී ඇති අතර එයින් බහුතරය ශිෂ්‍යයන් සහ විශ්වවිද්‍යාල පර්යේෂකයින්ගෙන් සමන්විත විය.



6 රූපය: හම්බන්තොට පිහිටි සූර්ය බලශක්ති යන්ත්‍රාගාරය

භූ තාප – භූ තාප සම්පත් තවදුරටත් විමර්ශනය කිරිම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අවධානය යොමු වී ඇති අතර වඩාත් සවිස්තර සම්පත් ඇගයීම් වැඩසටහනක් ඇතුලත් වාර්තාවක් සකස් කර ඇත. මෙම ප්‍රයත්නය සඳහා අයිස්ලන්තයේ එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාලයෙන් භූ තාප බලශක්ති සංවර්ධනය පිළබඳව විස්තීර්ණ පුහුණුවක් ලැබූ සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විසින් සහාය දක්වනු ලැබීය. මෙම වාර්තාව, උණු දිය උල්පත් 10 ක පවතින ජල විශ්ලේෂණයකින් සහ දිවයිනෙහි භූ තාප සම්පත් වල පරිමාමිතික ඇගයිමක් පදනම් කර සකස් කර ඇත. සුනිත්‍ය බලශක්ති අධිකාරිය මේ වන විට භූ තාප සම්පත් වල වඩාත් සවිස්තර ඇගයීමක් සඳහා වන ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීමේ ක්‍රියාවලියෙහි යෙදී සිටී.

### බලශක්ති සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම


මේ දක්වා ජල, සුළං සහ සූර්ය සම්පත් ආවරණය කරමින් දිවයිනෙහි ප්‍රදේශ කිහිපයක බලශක්ති සංවර්ධන ප්‍රදේශ බොහොමයක් ප්‍රකාශයට පත් කර ඇත. දීර්ඝ කාලීන සුළං දත්ත ඇගයීමෙන් සහ සිදු කරමින් පවතින ජෛවස්කන්ධ සම්පත් ඇගයීමේ වැඩසටහනේ ප්‍රතිඵල අනුව මෙය තවදුරටත් ශෝධනය කිරීමට නියමිතය.

### නව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති (NRE)

1996 වර්ෂයේදී පළමු විදුලිය නිපදවන කුඩා ජල විදුලි බලාගාරය (SPP) කොමිෂන් කිරීමත් සමඟින් නව පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය ආරම්භ කරන ලදී. කෙසේවෙතත්, අපේක්ෂා කල පරිදි NRE සංවර්ධනය වේගයෙන් සිදු නොවූ නමුත් වර්ෂයකට 0.5% ක ධාරිතා එක්කිරීමේ මධ්‍යයන වර්ධනයක්

සමඟින් එක තැන නතර වි තිබිණි. සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිහිටුවීම මඟින් සම්පත් වෙන්කිරීමේ ක්‍රියාවලිය විධිමත් කරන ලද අතර සංවර්ධනය කිරිම වේගවත් කරන ලදී.

1996 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සමුච්චිත ධාරිතා එක්කිරීම සහ NRE වල SPP ගණන 7 රූපයෙන් විදහා දැක්වේ.




රූපය 7: සමුච්චිත ධාරිතා එක්කිරීම සහ NRE වල SPP ගණන

NRE කර්මාන්තය සාක්ෂාත් කරගන්නා ලද ප්‍රගතිය 1 වගුව සහ 2 වගුව මඟින් පෙන්වා ඇත.

වගුව 1: සම්පත් අනුව ජාල සම්බන්ධිත විදුලි බලාගාර වල මුළු ස්ථාපිත ධාරිතාවය

| ස්ථාපිත ධාරිතාවය (මෙවො) | 2000 | 2005 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| ජල | 1,137.45 | 1,207.45 | 1,207.45 | 1,207.45 | 1,207.45 | 1,357.45 |
| තාප | 685.00 | 1,114.50 | 1,304.50 | 1,389.50 | 1,689.50 | 1,695.30 |
| CEB සුළං | 3.00 | 3.00 | 3.00 | 3.00 | 3.00 | 3.00 |
| NRE | 12.75 | 85.81 | 182.23 | 217.63 | 240.72 | 312.22 |
| එකතුව | 1,838.20 | 2,410.76 | 2,697.18 | 2,817.58 | 3,140.67 | 3,367.97 |
| **ස්ථාපිත ධාරිතාවය (%)** | **2000** | **2005** | **2009** | **2010** | **2011** | **2012** |
| ජල | 61.88 | 50.09 | 44.77 | 42.85 | 38.45 | 40.30 |
| තාප | 37.26 | 46.23 | 48.37 | 49.32 | 53.79 | 50.34 |


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| CEB සුළං | 0.16 | 0.12 | 0.11 | 0.11 | 0.10 | 0.09 |
| NRE | 0.69 | 3.56 | 6.76 | 7.72 | 7.66 | 9.27 |

2 වගුව: සම්පත් අනුව ජාල සම්බන්ධිත විදුලි බලාගාර වල දළ වාර්ෂික විදුලි උත්පාදනය

| දළ උත්පාදනය (ගිවොපැ) | 2000 | 2005 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| ප්‍රධාන ජල | 2,812.8 | 3,222.5 | 3,355.6 | 4,988.5 | 4,017.7 | 2,726.7 |
| තාප | 3,512.4 | 5,339.3 | 6,062.5 | 5,063.3 | 6,895.7 | 8,416.5 |
| CEB සුළං | 3.4 | 2.4 | 3.5 | 3.0 | 2.7 | 2.3 |
| NRE | 43.3 | 279.7 | 548.5 | 728.5 | 722.3 | 733.3 |
| එකතුව | **6,371.8** | **8,844.0** | **9,970.1** | **10,783.2** | **11,638.2** | **11,878.8** |
| **දළ උත්පාදනය (%)** | **2000** | **2005** | **2009** | **2010** | **2011** | **2012** |
| ජල | 44.1 | 36.4 | 33.7 | 46.3 | 34.5 | 23.0 |
| තාප | 55.1 | 60.4 | 60.8 | 47.0 | 50.3 | 59.0 |
| CEB සුළං | 0.05 | 0.03 | 0.04 | 0.03 | 0.02 | 0.02 |
| NRE | 0.7 | 3.2 | 5.5 | 6.8 | 6.2 | 6.2 |

2012 වර්ෂයේදී දළ ජාල විදුලි උත්පාදනය සඳහා NRE දක්වන ලද දායකත්වය 6.2% කි. 2011 වර්ෂයේ සහ 2012 වර්ෂයේ පැවති දීර්ඝ කාලීන නියඟය හේතුවෙන් ස්ථාපිත ධාරිතාවයෙහි වැඩිවීම සමඟින් පවා NRE හි ප්‍රධාන දායකත්වයක් ලබා දෙන කුඩා ජල විදුලි බලාගාර වලින් සිදු කරන උත්පාදනයෙහි අඩුවීමක් නිරීක්ෂණය විය.

7 රූපයෙන් 1996 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වර්ගය අනුව **NRE** සම්පත් වලින් විදුලි උත්පාදනය විදහා දැක්වේ.




8 රූපය: සම්පත් අනුව NRE මඟින් විදුලි උත්පාදනය

2012 වර්ෂයේදී කොමිෂන් තරන ලද ව්‍යාපෘති වර්ග වලට කුඩා ජල විදුලි, ජෛවස්කන්ධ (ඩෙන්ඩ්‍රො, MSW සහ අවසාදිත) සහ සූර්ය බලශක්ති අයත් වේ. 2012 වර්ෂය අවසානය වන විට විවිධ සංවර්ධන අවධි වල පසුවන අදාල තාක්ෂණයන් වල ගණන සහ ධාරිතාවය 3 වගුවෙහි දක්වා ඇත.

3 වගුව: තාක්ෂණය අනුව විවිධ සංවර්ධන අවධි වල පසුවන යන්ත්‍රාගාර සංඛ්‍යාව සහ ධාරිතාවයන්

| තාක්ෂණය/ තත්ත්වය | ජෛවස්කන්ධ | | කුඩා ජල විදුලි | | සුළං | | සූර්ය සහ වෙනත් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ගණන | මෙවො | ගණන | මෙවො | ගණන | මෙවො | ගණන | මෙවො | ගණන | මෙවො |
| ප්‍රාදේශීය අනුමැතීන් | 4 | 17.6 | 42 | 63.4 | 1 | 10 | 8 | 62.3 | 55 | 153.3 |
| ඉදිකරමින් පවතින | 17 | 84.8 | 94 | 190.0 | 4 | 21.3 | - | - | 115 | 296.1 |
| කොමිෂන් කරන ලද | 2 | 10.5 | 107 | 227.3 | 9 | 73.0 | 4 | 1.38 | 122 | 312.2 |

ශ්‍රී ලංකාවේ පවතින බොහෝ සෙයින් වඩාත් සංවර්ධිත පුනර්ජනනීය බලශක්ති සම්පත වන්නේ කුඩා ජල විදුලියයි. වර්තමානයේදී, එමඟින් ජාල විදුලි උත්පාදනය ක්ෂේත්‍රය සඳහා පමණක් ලබා දෙන දායකත්වය 2012 වර්ෂය අවසානය වනවිට යන්ත්‍රාගාර 207 කින් මෙවො 227.3 ක් ලෙස පැවතිණි. 212 වර්ෂය දක්වා වෙනත් තාක්ෂණයන් මඟින් එක්කල සමුච්චිත ධාරිතාවය, සුළං බලශක්ති මෙවො 73.0, ජෛවස්කන්ධ මෙවො 10.5 සහ සූර්ය බලශක්තිය මෙවො 1.4 ක් ලෙස විය.

තාක්ෂණ සංවර්ධන ප්‍රයත්නයක් ලෙස ශ්‍රී ලංකාවේ වේවින් පෞද්ගලික සමාගම සහ ඩෙන්මාර්කයේ පුනර්ජනනීය බලශක්තිය සඳහා නෝර්ඩික් ෆෝක් සෙන්ටර් විසින් ශ්‍රී ලංකාවේදී සුළං ටර්බයින තල සාර්ථකව වාත්තු කිරීම සිදු කරන ලදී. (8 රූපය බලන්න) ජාල පරිමාණයේ ප්‍රථම සුළං ටර්බයිනය ශ්‍රී ලංකාව තුල නිෂ්පාදනය කිරීම සම්පූර්ණ කිරීම සඳහා ප්‍රධාන තාක්ෂණයන් ඒකාබද්ධ කිරීමේ මහත් පරිශ්‍රමයන් මේ වන විට දරමින් පවතී. මෙම මුලපිරිම මඟින් පවතින පිරිවැය ව්‍යුහයන් තුල සුළං බලශක්තියෙහි පිරිවැය කිවොපැ 01ක් සඳහා රු. 17.00 ක් ලෙස අඩු කරනු ඇත. මෙය විදුලිය විකිණීමේ මධ්‍යයන මිළ ගණන් සමඟ සම වනු ඇති අතර ශ්‍රී ලංකාව තුල සමෘද්ධිය ඇති කිරීමේ මාවත සකසමින් දේශීය අගය එක්කිරීම, රැකීරක්ෂා ඇතිකිරීම සහ හැකියා වර්ධනය සඳහා නව මාවත් විවර කරනු ඇත.



9 රූපය: සුළං ටර්බයින තල දේශීයව නිෂ්පාදනය කරමින්

ඉදුරාන ක්ෂුද්‍ර ජලවිදූලි ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී කොමිෂන් කරන ලද අතර එමඟින් ජාතික ජාලය සඳහා වාර්ෂිකව ගිවොපැ 0.22 ක් එක් කරනු ඇති බවට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතියෙන් ලැබෙන ආදායම පාසැල් ළමුන් සහ මහජනතාව සඳහා ක්ෂුද්‍ර ජලවිදූලි තාක්ෂණය ප්‍රදර්ශනය කරනු ලබන ස්වයංපෝෂිත දැනුම් කේන්ද්‍රයක් ලෙස සංවර්ධනය කිරිම සඳහා ප්‍රයෝජනයට ගනු ඇත. ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියානු විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් සහ වෘත්තිකයන් ඉලක්ක කර ගනිමින් යන්ත්‍රාගාර මෙහෙයුම් සහ කළමනාකරණය සඳහා විශේෂ අවධානය යොමු කරමින් පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකාරී වනු ඇති අතර පරිසර හිතකාමී බලශක්ති උත්පාදන විකල්පයන්ද ප්‍රවර්ධනය කරනු ඇත. මෙම විදුලි බලාගාරයේ සවි කර ඇත්තේ සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත අඩු උසක් සඳහා සුදුසු හරස් ගලනයක් සහිත (low head cross flow) ටර්බයිනයකි.

ඉදිකිරීමේ සහ ස්ථාපිත කිරීමේ කාලපරිච්ඡේදය තුලදී යන්ත්‍රාගාරයේ සමහර කොටස් 10 රූපයෙන් පෙන්නුම් කෙරේ.



10 රූපය: දිය ඇළ සහ දේශීයව නිෂ්පාදිත ජල විදුලි ටර්බයිනය

## වතු ජල විදුලි යන්ත්‍රාගාර නැවත බලගැන්වීම

වතු ක්ෂුද්‍ර ජලවිදුලි නැවත බලගැන්වීමේ නියමු ව්‍යාපෘතිය සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි සංවර්ධන සහකරුවෙකු විසින් අරමුදල් සපයනු ලබන පළමු ව්‍යාපෘතිය වේ. වතු ජලවිදුලි ව්‍යාපෘති 20 ක් පමණ නැවත බලගැන්වෙන මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව ඇ.ඩො.මි. 1.29 ක ඔඩපනයක් ලබා දී ඇත. ණය යෝජනාක්‍රමය ක්‍රියාවට නැංවීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, සහභාගීත්ව මූල්‍ය ආයතන (PFI) සහ බලශක්ති සේවා සමාගම් (ESCO) සමඟ හවුල්කාරීත්වයකට ඇතුලත් වනු ඇත. විශේෂඥයින්, PFI සහ ESCO තෝරාගැනිම සඳහා ව්‍යාපෘතිය සිදු කරමින් පවති.

## පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා දත්ත සමුදාය

සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් නව පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘති සඳහා වන ඉල්ලුම්පත් රාශියක් සළකා බලමින් පවතී. මෙම ඉල්ලුම්පත් බොහොමයක් පර්යන්ත අනුමත කිරීමේ අධිකාරීන්හි සළකා බලමින් අනුමත කිරීමේ වෙනස් වන අවධි වල පසුවේ. සියළු අනුමත කිරීමේ අධිකාරීන් වලට තොරතුරු සඳහා නිදහස් ප්‍රවේශයක් ඇති කිරීම සඳහා අනුමත කිරීමේ ක්‍රියාපිළිවෙල පොදු වෙබ් පදනම් වේදිකාවකට ගෙන ඒම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ව්‍යාපෘතියක් සම්පාදනය කර ඇත. ව්‍යාපෘති සංවර්ධනයට පහසුකම් සපයමින් සහ වේගවත් කරමින් මෙම වේදිකාව කාර්ය ගලනය සඳහා පහසුකම් සපයනු ඇති අතර සංවර්ධකයින් සහ අනුමත කිරීමේ අධිකාරීන් සඳහා ස්වයංක්‍රීය තත්ත්ව යාවත්කාලීන කිරීම් සිදු කරනු ඇත.

## ග්‍රාමීය බලශක්ති සේවාවන්

අඩු පහසුකම්ලාභී ප්‍රජාවන් සඳහා ජාලයෙන් පිටත විදුලිය සැපයීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් " ග්‍රාමශක්ති - ග්‍රාමීය අඩු පහසුකම්ලාභී ප්‍රජාවන් සඳහා වැඩිදියුණු කල බලශක්ති සේවාවන් සැපයීම" යන මැයෙන් වැඩසටහනක් සම්පාදනය කර ඇත. මෙම වැඩසටහනෙහි අදියර 1 වශයෙන් 2012 වර්ෂයේ සැප්තැම්බර් මසදී ශ්‍රී ලංකාවේ වඩාත් දුෂ්කර ග්‍රාමයක් වන මීමුරේ ග්‍රාමයෙහි ගෘහස්ථයන් 115 ක්, පාසැල් 02 ක්, එක් ග්‍රාමීය රෝහලක් සහ සමෘද්ධි බැංකුවක් සහ ග්‍රාම නිලධාරී කාර්යාලයක් සඳහා බලශක්තිය ලබා දෙමින් කිවො 63 ක ක්ෂුද්‍ර ජලවිදුලි ව්‍යාපෘතියක් පුනරුත්ථාපනය කර කොමිෂන් කර ඇත. සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාලය ඉදිකිරීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් රු.මි. 6 ක වියදමක් දරා ඇත. මීට අමතරව, මීමුරේ ග්‍රාමය ආසන්නයේ පවතින ගම්මාන 10 කට පමණ ක්ෂුද්‍ර ජලවිදුලි සහ සූර්ය බලශක්ති පද්ධති තුලින් විදුලි බලය ලබා දීමට නියමිතය.



11 රූපය: ජාලයෙන් පිටත විදුලි බලය සැපයීමේ ව්‍යාපෘතිය - මීමුරේ

## ග්‍රාමීය පවුල් සඳහා උඳුන් බෙදාදීම

අවශ්‍යතා සහිත පවුල් 10,000 ක් සඳහා වැඩිදියුණු කල උඳුන් ලබා දීම තුලින් යුද්ධයෙන් විනාශයට පත් වූ නැගෙනහිර ප්‍රදේශය පුනරුත්ථාපනය කිරීමේ උත්සාහයන් සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය දායකත්වය දක්වා ඇත. බෙදාදෙන ලද උඳුන් වර්ගය මෙරට වඩාත් ජනප්‍රිය වැඩිදියුණු කරන ලද පිඝින උඳුන වන "අනගි" ලිප් දෙකකින් යුත් මැටි උඳුනයි. වැඩිදියුණු වූ ගෘහස්ථ වායු තත්ත්වය සහ අඩු දර පරිභෝජනය මෙම අසරණ ජනතාවගේ වඩාත් හොඳ ජීවන තත්ත්වයන් සහ වැඩිදියුණු වූ ආර්ථික තත්ත්වයන් සඳහා දායක වනු ඇති බවට අපේක්ෂා කෙරේ.



12 රූපය: වැඩිදියුණු කරන පද පිසින උඳුන් බෙදාදීම – නැගෙනහිර පළාත

## පුනර්ජනනීය බලශක්ති දැනුවත්කිරීමේ වැඩසටහන්

පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයට පහසුකම් සැපයීම සහ බලගැන්වීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පුනර්ජනනීය බලශක්ති කණ්ඩායම විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වා ඇත. මෙම වැඩසටහන් දෙක පිළිවෙලින් 2012 මාර්තු මස 15 – 16 සහ 2012 ජූනි 28 – 29 දිනයන්හි පවත්වා ඇත. මෙම වැඩසටහන් වල මූලික ඉලක්කගත කාණ්ඩය වූයේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සිදු කරගෙන යෑම සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලියේ නිරතව සිටින සහ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වල නිරතව සිටින ඉහත නියෝජිතායතන වල නිලධාරීන් වේ. වැඩමුළුවෙහි අරමුණු වූයේ


- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා රජයේ ප්‍රතිපත්ති සහ ඉලක්කයන්, සම්පත් වෙන්කිරීමේ ක්‍රියාවලිය, බලශක්ති සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සහ NRE ව්‍යාපෘති වල ජාල අන්තර්සම්බන්ධතාවය පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම,
- ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුවේ කාර්යභාරය සහ අනුමත කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටින රේඛීය නියෝජිතායතන වල නිලධාරීන්ගේ වගකීම් පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම,

- බැහැර කරන ලද ප්‍රදේශ වලට ආසන්නව ස්ථානගත කර ඇති ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දීමේ සැලසුම් ගැටළු සහ ගතහැකි විසඳුම් සාකච්ඡා කිරීම සහ ගැටුම් නිරාකරණය කිරීම සඳහා PAC නියෝජිතයින් සමඟ කතිකාවතක් ඇති කිරීම.

**" පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයෙහි සම්පත් වෙන්කිරීමට පහසුකම් සැපයීම සහ බලගැන්වීම" යන මැයෙන් මේ සඳහා විශේෂ ප්‍රවර්ධන පොත් පිංචක්ද සකස් කරන ලදී.**

## බලශක්ති තොරතුරු කළමනාකරණය

පනතෙහි 42 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි වාර්ෂික බලශක්ති ගිණුම අමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවයකි. අවසන් ශ්‍රී ලංකා බලශක්ති තුලනය (2007) 2009 වර්ෂයේදී ප්‍රකාශයට පත් කර ඇත. කෙසේවෙතත්, පැවති අතපසුවීම් නිවැරදි කර 2008, 2009 සහ 2010 ශ්‍රී ලංකා බලශක්ති තුලන 2012 වර්ෂයේදී ප්‍රකාශයට පත් කිරීම සඳහා දැඩි පරිශ්‍රමයක් දරන ලදී. 2012 වර්ෂය සඳහා ප්‍රකාශනය 2012 වර්ෂයේ ජූලි මාසයේදී මුද්‍රණය කරන ලද අතර, සෙසු ප්‍රකාශන තුන 2012 වර්ෂය අවසානය වන විට සම්පූර්ණ කරන ලදී. (13 රූපය බලන්න)





13 රූපය: ශ්‍රී ලංකා බලශක්ති තුලනය ප්‍රකාශන

ජාතික මට්ටමින් දත්ත ග්‍රහණය කිරීමේ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් උපදේශක කමිටු 4 ක් පත් කරන ලදී. පිළිවෙලින් ඛණිජතෙල් ක්ෂේත්‍රය සහ බලශක්ති තුලනය සඳහා වන මෙම උපදේශක කමිටු වලින් දෙකක් 2012 වර්ෂයේ මුල් භාගයේදී රැස් වූ අතර ඔවුන්ගේ නිර්දේශයන් 2011 වර්ෂයේ ශ්‍රී ලංකා බලශක්ති තුලනයෙහි ඇතුලත් කර ඇත.

බලශක්ති ඉල්ලුම විශ්ලේෂණය කිරීම සඳහා වන ආකෘතිය භාවිතා කරමින් බලශක්ති ඉල්ලුම පුරෝකථනය කිරීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සැලසුම් කරයි. අන්තර්ජාතික පරමාණුක බලශක්ති අධිකාරියෙහි සහයෝගීත්වයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සහ පරමාණුක බලශක්ති අධිකාරිය විසින් සංවිධානය කරන ලද 2012 මාර්තු මස 19 සිට 30 දක්වා පැවති වැඩමුළුවේදී අකෘතියේ භාවිතය පිළිබඳව සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි නිලධාරීන් දෙදෙනෙක් පුහුණු කරන ලදී. දත්ත එකරැස් කිරීම සිදු කරමින් පවතින අතර කාර්යය ඉදිරියට සිදු කරගෙන යෑම සඳහා කාර්ය කණ්ඩායමක් පත් කිරීමට අපේක්ෂා කෙරේ.

ජාතික බලශක්ති ගිණුමෙහි සත්කාරකය (host) ලෙස විශේෂ වෙබ්-සත්කාරක දත්ත සමුදා යෙදවීමක් 2012 පෙබරවාරි මස සකස් කරන ලද අතර විදුලිබල සහ බලශක්ති අමාත්‍යවරයා විසින් එය දියත් කරන ලදී (14 වැනි රූපය බලන්න)1970 සිට වර්තමානය දක්වා බලශක්ති තොරතුරු ප්‍රදර්ශනය කරන වෙබ් අඩවියට www.info.energy.gov.lk මඟින් ප්‍රවේශ විය හැක.




**Generation Sri Lanka (GWh)**

| | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|---|
| Hydro, CEB and SPP | 3,450.4 | 4,634.0 | 3,946.9 | 4,129.4 | 3,881.1 | 5,634.5 |
| Thermal, CEB, IPP and Hired | 5,339.3 | 4,805.1 | 5,894.6 | 5,848.8 | 6,062.5 | 5,063.3 |
| Non-Conventional, CEB | 2.4 | 2.3 | 2.3 | 3.2 | 3.5 | 3.0 |
| Self-Generation By Customers | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 |
| Off-Grid, Conventional | 78.5 | 78.5 | 78.5 | 0.0 | 0.0 | 0.0 |
| Off-Grid, Non-Conventional | 13.7 | 14.7 | 15.6 | 16.2 | 16.8 | 17.5 |
| Gross Generation Sri Lanka | 8,884.4 | 9,534.6 | 9,937.9 | 9,997.6 | 9,963.9 | 10,718.3 |

**Total Losses in Sri Lanka**

| | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|---|
| T&D Loss (GWh) | 1,553.2 | 1,560.7 | 1,530.6 | 1,469.4 | 1,431.4 | 1,486.9 |
| Power Plant Own Use (GWh) | 91.7 | 118.0 | 147.1 | 168.2 | 166.9 | 106.9 |
| Total Own Use and Loss (GWh) | 1,644.9 | 1,678.6 | 1,677.7 | 1,637.6 | 1,598.3 | 1,593.8 |
| Total Own Use and Loss (% of Gross Gen) | 18.7 | 17.8 | 17.0 | 16.4 | 16.0 | 14.8 |


**14 රූපය: වෙබ් අඩවියෙහි පවතින ජාතික බලශක්ති ගිණුම**

## පශ්චාත් ව්‍යාපෘති බලපෑම් අධ්‍යයන සහ පාරිසරික බලපෑම්

ජාල සම්බන්ධිත විදුලි බලාගාර වලින් සිදුවන $CO_2$ වායු විමෝචනය ඇගයීම සඳහා, සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් http://cdm.unfccc.int/methodologies/PAmethodologies/tools/am-tool-07-v2.pdf.හි පවතින IPCC ක්‍රමවේදය අනුගමනය කරමින් 2008, 2009, 2010 සහ 2011 වර්ෂ සඳහා ජාල විමෝචන සාධක (GEF) ගණනය කරන ලදී. GEF අගයන් ශ්‍රී ලංකා බලශක්ති තුලනය 2011 හි විශේෂ පරිච්ඡේදයක පළමුවරට ප්‍රසිද්ධියට පත් කර

ඇත. UNFCCC CDM විධායක මණ්ඩලයේ 35 වැනි රැස්වීමේදී ගන්නා ලද තීරණයට අනුව, සත්කාරක රට තෝරාගන්නා ලද ජාතික අධිකාරියකට (DNA) විදුලි පද්ධතිය සඳහා GEF ප්‍රසිද්ධියට පත් කල හැකි වේ.

ශ්‍රී ලංකාවේ DNA වන්නේ පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වන අතර GEF ගණනය කිරීමේ සහ ප්‍රසිද්ධියට පත් කිරීමේ වගකීම සුනිත්‍ය බලශක්ති අධිකාරිය භාර ගෙන ඇත. 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ඇස්තමේන්තුගත GEF අගයන් 15 රූපයේ දක්වා ඇත. 2011 වර්ෂයේ GEF හි ඇති වූ වැඩිවීම එම වර්ෂයේ පැවති දිගු කාලීන නියගය හේතුවෙන් ජල විදුලි උත්පාදනයෙන් දක්වන ලද අඩු දායකත්වය හේතුවෙන් ඇති වූවකි.




15 රූපය: ශ්‍රී ලංකාවේ GEF අගයන්

ක්‍රියාකාරී ක්ෂුද්‍ර ජලවිදුලි ව්‍යාපෘති සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පශ්චාත් ව්‍යාපෘති බලපෑම් ඇගයීම් අධ්‍යයන දෙකක් සම්පාදනය කර ඇත, ඉන් එක් අධ්‍යයනයක් විශේෂයෙන්ම පාරිසරික බලපෑම් පිළිබඳව බලශක්ති බලපත්‍රයේ (EP) කොන්දේසි සමඟ ව්‍යාපෘති ක්‍රියාකාරීත්වයේ අනුකූලතාව ඇගයීම වන අතර අනෙක් අධ්‍යයනය පවතින ව්‍යාපෘති වල තාක්ෂණික ගතිලක්ෂණ අධ්‍යයනය කිරිම සහ අංගයන් උත්ශ්‍රේණිගත කිරීම වේ. පශ්චාත් පාරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යයනයෙහි අරමුණ වන්නේ පාරිසරික සම්මතයන් ගොඩ නැංවීම සඳහා සත්‍ය පශ්චාත් ව්‍යාපෘති තත්ත්වයන් පිළිබඳ වඩාත් හොඳ තොරතුරු සැපයිම තුලින් නව පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය කිරිම සඳහා දායක වීම වේ. මේ වන විට මෙම අධ්‍යයනය සඳහා කෙටුම්පත් ToR සහ ටෙන්ඩර් ලියකියවිලි සකස් කර ඇති අතර, මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සමඟ සහයෝගීත්වයෙන් අධ්‍යනය සිදු කිරිම සඳහා ඔවුන් සමඟ සාකච්ඡා කරමින් පවතී. පශ්චාත් ස්ථාපිත ක්ෂුද්‍ර ජලවිදුලි ව්‍යාපෘති වල තාක්ෂණික ශක්‍යතාව ඇගයීම අරමුණු කරගත් තාක්ෂණික ගතිලක්ෂණ ආවරණය කරනු ලබන ව්‍යාපෘති සංඝටකය විසින් ද්‍රාව කාර්යක්ෂමතාවය වලංගු කිරීම සහ ජාලයට ලබා දුන් විදුලි බලය ස්ථිර කිරීම වැනි අපේක්ෂිත ප්‍රතිඵල සහතික කිරීම සාක්ෂාත් කරගෙන ඇත. විවිධ ධාරිතා පරාසයක බලාගාර 6 ක් තෝරා ගන්නා ලදී. ක්ෂුද්‍ර ජලවිදුලි බලාගාර වල විශිෂ්ට කාර්ය සාධනය සඳහා එක්රැස් කරගන්නා ලද දත්ත විශ්ලේෂණය කිරීමෙන් පසුව කණ්ඩායම විසින් පරීක්ෂණ සිදුකර බලාගාර වෙත නිර්දේශ ලබා දෙනු ලැබේ.



16 රූපය: කුඩා ජල විදුලි බලාගාරයක කාර්ය සාධනය ඇගයීමේදී ගැලීම් මිනුම් ලබාගැනීම

## ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල

පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතීන්හි අනුමත ආයෝජන ප්‍රමාණය සඳහා මුදල් ප්‍රවාහ අවශ්‍යතා ගණනය කර ඇති අතර එම අවශ්‍යතා සඳහා යොදාගත හැකි මූල්‍ය ප්‍රභව දෙකක් ලෙස (1) පොසිල ඉන්ධන ආනයනයේදී සෙස් බද්දක් අය කිරීම (2) ප්‍රධාන ජලවිදුලි බලාගාරවලින් උත්පාදනය පදනම් කර ගත් පුරස්කාරයක් අය කිරීම හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලේ තිරසාරභාවය සහතික කිරීම පිණිස අනුමත ආයෝජන ප්‍රමාණය ADB හි තාක්ෂණික සහයෝගීතා වැඩසටහනක විශේෂඥයෙකු විසින් ඇගයීමට භාජනය කර ඇත. ශ්‍රී.ල.සු.බ.අ. තවදුරටත් වැඩිදියුණු කර ගැනීම සඳහා, සමස්ත ආයෝජන ප්‍රමාණය වැඩසටහන්ගත පිරිසිදු සංවර්ධන ක්‍රියාදාමයකට (CDM) මුලපිරීමක් සඳහා සමූහනය කිරීම පිළිබඳව හෝ කාබන් මූල්‍යකරණයෙන් කොටසක් ලබා ගැනීමට ශ්‍රී ලංකා කාබන් අරමුදල බලගැන්වීම සඳහා හෝ අධ්‍යයනය කර ඇත.

## සුනිත්‍ය බලශක්ති ඇප අරමුදල


ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති ඇප අරමුදලේ කාර්යයන්, ශ්‍රී.ල.රු.මි. 50 ක සංචිත අරමුදලකින් ක්‍රියාකාරි වූ සුනිත්‍ය ඇප පහසුකමෙහි මෙහෙයුම් වල උරුමය ලබමින් අරඹනු ලැබීය. 6% ක පොළී අනුපාතිකයකට "E-Friends II" ණය පහසුකම යටතේ පහසු ණය ලබා දුන් බලශක්ති කාර්යක්ෂමතා ව්‍යාපෘති පමණක් ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් වල කිසිදු සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කර නොමැත. පනතෙහි 47 ඡේදයෙහි විධිවිධාන යොදාගනිමින් මෙම පහසුකම විධිමත්ව ස්ථාපිත කිරිම සඳහා මුලපිරිමක් සිදු කර ඇති අතර මෙම පහසුකම් පිළිබඳව සකස් කරන ලද නියාමනයක් මේ වන විට නීති කෙටුම්පත්පත් දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂා කරමින් පවතී.

## ව්‍යාපෘති සඳහා නිශ්චල දේපල අත්පත්කර ගැනීම සහ බදුගැනීම

දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ පැවැති සාකච්ඡා කිහිපයකින් පසුව ජලවිදුලි ව්‍යාපෘති සඳහා අවශ්‍ය ජල අයිතීන් පැකේජගත කිරීමට හැකි වී ඇති අතර ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීම ඒ හා සම්බන්ධ වෙමින් පවතී. වර්තමානයේදී, ප්‍රාදේශීය අනුමැතීන් අදාල දිස්ත්‍රික් ලේකම් විසින් නිකුත් කිරීම, ඉඩම් අවශ්‍යතාවය ස්වයංක්‍රීයව හඳුනා ගැනීමේ ක්‍රියාවලියක ආරම්භයට තුඩුදීම හේතුවෙන් ඒ සඳහා වන සංවර්ධකයාගේ ප්‍රයත්නය සහ කාලය විශාල ලෙස අවම වී ඇත. ඉඩම් අත්පත් කර ගැනීම කඩිනම් කර ගැනීම සඳහා අධිකාරිය විසින් දිරි ගැන්වීමේ ක්‍රමයක් හඳුන්වා දුන් අතර මේ වන විට අත්පත් කර ගැනීම් 4 ක් සම්පූර්ණ කර තවත් 28 ක් ක්‍රියාත්මක වෙමින් පවතී. මේ වන විටත් පවරා ගෙන ඇති ඉඩම් 28 ට අමතරව 2012 වර්ෂයේදී තවත් ඉඩම් අත්පත් කර ගැනීමේ අවස්ථා 6 ක් සංවර්ධකයන් විසින් අධිකාරිය වෙත භාර දී ඇත.

## බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, සංරක්ෂණය සහ කළමනාකරණය

2020 වර්ෂය වන විට විදුලිබල පරිභෝජනයෙන් ගිවොපැ 2000 ක් පමණ, එනම් 2010 වර්ෂයේ විදුලිබල පරිභෝජනයෙන් 20% ක් හා සමාන ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමේ ඉලක්කයක් සමඟින් ජාතික අරමුණක් ඔස්සේ බලශක්ති කළමනාකරණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී. විවිධ වැදගත් අවස්ථාවලදී ප්‍රක්ෂිප්ත විදුලිබල ඉතිරිය 17 රූපයෙන් විදහා දැක්වේ.




17 රූපය: DSM මඟින් ප්‍රක්ෂිප්ත විදුලිබල ඉතිරි කිරීම

4 වගුව මඟින්ද 2012, 2016 සහ 2020 වර්ෂ සඳහා ශුද්ධ උත්පාදනයේ ප්‍රතිශතයක් ලෙස විදුලිබලය ඉතිරිකිරීමේ ඉලක්කයන් විදහා දැක්වේ.

4 වගුව: විදුලිබලය ඉතිරිකිරීමේ ඉලක්කයන්

| වර්ෂය | ඉලක්ක ඉතිරිකිරීම් (ශුද්ධ උත්පාදනයේ % ලෙස) |
|---|---|
| 2012 | 4.3 |
| 2016 | 6.4 |
| 2020 | 8.7 |

වර්ෂ 2020 වන විට මැදිහත්වීමේ විශේෂිත ක්ෂේත්‍ර වලින් විදුලිබල ඉතිරිකිරීමේ ඉලක්කයන් 5 වගුවෙහි දක්වා ඇත.

වගුව 5: විවිධ මැදිහත්වීම් තුලින් 2020 වර්ෂය වන විට වාර්ෂික විදුලිබල ඉතිරිකිරීමේ ඉලක්කයන්

| තාක්ෂණය / ක්‍රියාවලිය | වාර්ෂික ඉතිරිකිරීම (ගිවොපැ) | තාක්ෂණය / ක්‍රියාවලිය | වාර්ෂික ඉතිරිකිරීම (ගිවොපැ) |
|---|---|---|---|
| ▪ බලශක්ති නාමකරණ වැඩසටහන | | ▪ කාර්යක්ෂම මෝටර | 185 |
| - *සිවිලිං පංකා* | 35 | ▪ ගොඩනැගිලි කළමනාකරණ පද්ධති | 20 |
| - *නලාකාර ප්‍රතිදීප්ත විදුලි පහන්* | 65 | ▪ කාර්යක්ෂම කාර්යාල උපකරණ | 16 |
| - *චුම්බක බැලස්ට* | 80 | ▪ සූර්ය ජල තාපක | 5 |
| - *ශීතකරණ* | 16 | ▪ විදුලි සංදේශ | 10 |
| ▪ කාර්යක්ෂම ආලෝකකරණය | 173 | ▪ කාර්යක්ෂම වායු සම්පීඩක | 11 |
| ▪ වායු සමීකරණය | 250 | ▪ තාපදීප්ත විදුලි පහන් ඉවත් කිරීම | 205 |
| ▪ ISO 50001 | 375 | ▪ හරිත ගොඩනැගිලි | 550 |
| එකතුව | | ගිවොපැ **1,990** | |

2012 වර්ෂයේ ජනවාරි මස සිට අගෝස්තු මාසය දක්වා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් ලෙස වාර්තාගත විදුලිබල ඉතිරිකිරීම් පහත පරිදි වේ:


- කර්මාන්ත සහ වාණිජ අංශ වල බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම තුලින් ගිවොපැ 37 ක් ඉතිරි කිරීම.
- ඉන්ධන මාරු කිරීමේ මුලපිරීම් තුලින් ඩීසල් ලීටර් මිලියන 8.7 ක් සහ දැවි තෙල් ලීටර් 0.61 ක් ඉතිරි කිරීම.

## නියාමනයන්

පවතින සහ යෝජිත ගොඩනැගිලි, කර්මාන්ත පරිශ්‍ර, ඉඩම් වාහන, නැව් සහ ගුවන් යානා සඳහා සීමාවන් සහ භාවිත සංග්‍රහයන් පැනවීම සුනිත්‍ය බලශක්ති අධිකාරියට පැවරී ඇති එක් ප්‍රධාන නියාමන මැදිහත්වීමකි. මේ යටතේ, 2009 වර්ෂයේදී සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ බලශක්ති කාර්යක්ෂමතා ගොඩනැගිලි සඳහා භාවිත සංග්‍රහයක් (බලශක්ති කාර්යක්ෂමතා ගොඩනැගිලි සංග්‍රහය ලෙස හඳුන්වන) සම්පාදනය කර ප්‍රසිද්ධියට පත් කර ඇත. ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවන් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය (UDA), ප්‍රාදේශීය සභා සහ පළාත් පාලන ආයතන විසින් ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා බලශක්ති කාර්යක්ෂමතා ගොඩනැගිලි සංග්‍රහය හඳුන්වා දෙනු ඇති බවට අපේක්ෂා කෙරේ. මේ වන විට නාගරික සංවර්ධන අධිකාරියෙන් ගොඩනැගිලි සැලසුම් අනුමැතිය සඳහා ඉල්ලුම්කරන ලද ගොඩනැගිලි 03 ක් සඳහා ඔවුන් සංග්‍රහය සමඟ අනුකූල වීම හේතුවෙන් සහතික නිකුත් කර ඇත.

## බලශක්ති කළමනාකරුවන්, බලශක්ති විගණකවරුන් සහ බලශක්ති සේවා සපයන්නන් බලාත්මක කිරීම

බලශක්ති කළමනාකරුවන් සහ බලශක්ති විගණකවරුන් පත්කිරීම සඳහා වන නියාමනයන් 2011 වර්ෂයේ ජූලි මස ප්‍රසිද්ධියට පත් කරන ලද අතර එයට අනුකූලව වාණිජ සහ කර්මාන්ත අංශයන් ආවරණය කරමින් තොග බලශක්ති පරිභෝජන ආයතන වලට බලශක්ති කළමනාකරුවන් 142 දෙනෙකු පත් කරන ලදී.




18 රූපය: මධ්‍යම සහ මහා පරිමාණ කර්මාන්ත සහ වාණිජ අංශ වල සමුච්චිත විදුලි පරිභෝජනය

මෙය දීර්ඝ කාලීන අනවරත වැඩසටහනක් වන අතර මෙම ව්‍යාපෘතියේ අවසන් අරමුණු වන්නේ මුළු කර්මාන්ත බලශක්ති පරිභෝජනයෙන් 80% ක් සඳහා දායක වන ආයතන 1,525 ක ISO 50001 සම්මතයන් වල විස්තර කර ඇති බලශක්ති කළමනාකරණ පද්ධති හා සමාන බලශක්ති කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම වේ ( 18 රූපයේ දක්වා ඇති පරිදි). 5 වගුවෙහි ප්‍රමාණාත්මකව දක්වා ඇති පරිදි, උපරිමයෙන් ක්‍රියාවට නැංවූ විට මෙම වැඩසටහනෙන් පමණක් වාර්ෂිකව ගිවොපැ 375 ක් ඉතිරි කරනු ඇති බවට අපේක්ෂා කෙරේ.



රූපය 19: ප්‍රථම බලශක්ති කළමණාකරන කණ්ඩායම

### බලශක්ති විගණන

බලශක්ති සංරක්ෂණය කරා යොමු වීම සඳහා ආයතන සඳහ තාක්ෂණික උපදෙස් ලබා දීමේ අරමුණ පෙරදැරි කර ගනිමින් බලශක්ති විගණන සිදු කර ඇත. 2012 වර්ෂය තුලදී කඩිනම් බලශක්ති විගණන 79 ක් සිදු කර ඇත.

### බලශක්ති කාර්යක්ෂමතා සේවාවන්

බලශක්ති කාර්යක්ෂමතා සේවාවන් අනවරත වැඩසටහනක් වන අතර ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ලියාපදිංචි වී ඇති බලශක්ති සේවා සමාගම් (ESCOs) හරහා සේවා සැපයීම සිදු කරනු ලැබේ.මෙම සේවාවන් වලින් ආවරණය කරනු ලබන ප්‍රධාන මූලිකාංග සමහරක් වන්නේ, භාවිතා කරන අංශයන්හි බලශක්ති විගණනය කිරීම, බලශක්තිය අපතේ යෑමේ ක්ෂේත්‍ර හඳුනාගැනීම සහ බලශක්තිය ඉතිරිකිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම වේ.  සාමාන්‍ය මිල ගණන් යටතේ බලශක්ති මිනුම් උපකරණ සැපයීමෙන් පුහුණුව ලබාදීමෙන් සහ හැකියා

වර්ධනය කිරීමෙන් සුනිත්‍ය බලශක්ති අධිකාරිය මෙම ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සපයනු ලැබේ. 2012 වර්ෂය තුලදී මෙවලම් දින 486 ක් වාර්තා වී ඇත.

### අංශ විශේෂිත බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන

බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම් වල තාක්ෂණික මැදිහත්වීම් කිසියම් අංශයක් බලශක්ති භාවිතා කරන ආකාරය මත රඳා පවතී. එබැවින්, බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණුකිරීම් සඳහා සමස්ථ ජාතික මට්ටමේ යටිතල පහසුකම් සංවර්ධනය කරන අතරම එක් එක් අංශයහි විශේෂිත තාක්ෂණික හැකියාවන් සංවර්ධනය කිරීම වැදගත් වේ. හෝටල්, තේ කර්මාන්තය, ඇඟළුම්, ජලය පොම්ප කිරීම, ගොඩනැගිලි-වායු සමීකරණය සහිත සහ රහිත සළකා බලන ලද අංශ සමහරකි. විශේෂයෙන්, පහත විස්තර කර ඇති "EU ස්විච්-ඒෂියා ග්‍රීනින් ශ්‍රී ලංකා" හෝටල් ව්‍යාපෘතිය යටතේ හෝටල් ක්ෂේත්‍රයේ විස්තීර්ණ බලශක්ති පරිභෝජන දත්ත සමූහයක් එක්රැස් කර ඇත.

<u>හෝටල් ක්ෂේත්‍රය</u>

හෝටල් වල බලශක්ති පරිභෝජනය 20% කින් අඩුකිරීම සාක්ෂාත් කර ගැනීම සඳහා වන ඉලක්කයක් සමඟින්, සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් යුරෝපා සංගමයේ සහයෝගීතාවය යටතේ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් ක්‍රියාවට නංවන ලද "EU ස්විච්-ඒෂියා ග්‍රීනින් ශ්‍රී ලංකා" හෝටල් ව්‍යාපෘතියෙහි තාක්ෂණික ප්‍රදානයන් ලබා දෙයි. ව්‍යාපෘතිය සඳහා ලියාපදිංචි වූ හෝටල් මාසික බලශක්ති පරිභෝජන දත්ත සහ නැඹුරුතා විශ්ලේෂණ ලබා දෙන අතර සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම පිළිබඳ නිර්දේශ, මඟපෙන්වීම සහ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ සහාය ලබා දේ. මෙම ව්‍යාපෘතිය යටතේ බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා හෝටල් 255 ක් සම්බන්ධ වේ.

## දැනුම කළමනාකරණය

### දැනුවත්කිරීමේ වැඩසටහන් සහ මාධ්‍ය ප්‍රකාශන

බලශක්තිය පිළිබඳ දැනුවත් වූ ජාතියක් ඇති කිරීමේ ඉලක්කය අනුව යමින් සම්මන්ත්‍රණ, ජනමාධ්‍ය ප්‍රකාශනන සහ අධ්‍යාපනික ක්‍රියාකාරකම් තුලින් දැනුවත්භාවය ඇතිකිරීම සිදු කර ඇත. පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති සංරක්ෂණය සහ කළමනාකරණය යන අංශ ආවරණය කරමින් සුනිත්‍ය බලශක්තියෙහි මූලික සංකල්ප පිළිබඳ සම්මන්ත්‍රණ සහ ඉදිරිපත්කිරීම් මාලාවක් පාසැල්, රජයේ ආයතන, පළාත් පාලන ආයතන සහ පෞද්ගලික අංශයේ සංවිධාන තුල පවත්වන ලදී. වැඩසටහන් සඳහා සහභාගීවූවන් හට විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ විශේෂයෙන් "විදුලි බිල්පත අඩුකර ගන්නේ කෙසේද?" පිළිබඳ පත්‍රිකා සහ පොත් පිංච ඇතුළුව තොරතුරු සහරා කිහිපයක් බෙදා දෙන ලදී. ප්‍රකාශයට පත් කරන ලද ලිපි මත පදනම් වූ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක්ද ඇතුලත් වූ බලශක්ති සංරක්ෂණ ව්‍යාපාරයක් මිහිර පුවත්පත සමඟ සහයෝගීත්වයෙන් පාසැල් ළමුන් ඉලක්ක කර ගනිමින් පවත්වා ඇත.




20 රූපය: සුනිත්‍ය බලශක්තිය පිළිබඳ පාසැල් දැනුවත්කිරීමේ වැඩසටහනක්

## අධ්‍යාපනික වැඩසටහන්

පොදු දැනුවත් කිරීමට අමතරව, වඩාත් විධිමත් මාර්ග ඔස්සේ සුනිත්‍ය බලශක්ති සංකල්ප පිළිබඳ අධ්‍යාපනය සහ හැකියා ගොඩනැංවීම සඳහා වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාවට නංවා ඇත.

### පසැල් සමාජ වැඩසටහන

දිවයින පුරා විවිධ අධ්‍යාපනික කලාප වල පිහිටි පාසැල් 60 ක සහභාගීත්වයෙන් 2012 වර්ෂයේදී ද පාසැල් බලශක්ති සමාජ වල ක්‍රියාකාරකම් සිදු කරගෙන ගොස් ඇත. ජාතික අධ්‍යාපන ආයතනයේ සහාය ඇතිව පාසැල් විෂය මාලාවෙහි (7 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා) විද්‍යාව විෂය සඳහා හඳුන්වාදුන් බලශක්ති ඒකකය ඵලදායීව අධ්‍යනය කිරිමට සහාය දැක්වීම සඳහා මෙම වැඩසටහන දියත් කරන ලදී. පාසැල තුල සහ අවට ප්‍රජාවන් ඉලක්ක කර ගනිමින් සුනිත්‍ය බලශක්තිය ඉදිරිපත් කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට අදාල වැඩසටහන් ක්‍රියාවට නැංවීම සඳහා එක් එක් පාසැල වෙත මූල්‍ය සහාය ලබා දී ඇත.

### බාලදක්ෂ වැඩසටහන

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය හා සහයෝගීතාවයෙන් බාලදක්ෂයින් සඳහා බලශක්ති සංරක්ෂණ වැඩසටහනක් හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන යටතේ බලශක්ති සංරක්ෂණය පිළිබඳ විෂයමාලාවක් අත්පොතක් ලෙස සකස් කර දිවයින පුරා බාලදක්ෂයින් වෙත බෙදාහැර ඇත. කොළඹ සහ මාතරදී පවත්වන ලද වැඩසටහන් 3 ක් මඟින් බාලදක්ෂ උපදේශකයින් පුහුණු කිරීම සිදු කර ඇත. බාලදක්ෂයින් සඳහා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවීණතා කණ්ඩායමක් ද ආරම්භ කරන ලදී.

තේමා උද්‍යාන

සම්පත්, තාක්ෂණික ක්‍රමවේද සහ පද්ධති වල ප්‍රායෝගික ඉදිරිපත්කිරීම් සහ පර්යේෂණ සහ සංවර්ධන සඳහා පුනර්ජනනීය බලශක්ති තේමා උද්‍යාන සංකල්පය යෝජනා කරන ලද අතර එහි පළමු උද්‍යානය හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානයෙහි ආරම්භ කරන ලදී. වර්තමානයේදී පැමිණෙන සියළු දෙනාහට PV සූර්ය විදුලි බලාගාර වල මෙහෙයුම් ගතිලක්ෂණ ප්‍රදර්ශනය කරන අතර අනෙකුත් සූර්ය බලශක්ති පරිවර්තනය කිරීමේ තාක්ෂණික ක්‍රමවේද සහ උපකරණ ප්‍රදර්ශනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ඉහළ නැංවීම සඳහා සැලසුම් කර ඇත.

### පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති කාර්යක්ෂමතා ($RE^3$) කලාප

විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා සිදු කරන ලද වැඩසටහන් අතර සමහර වැඩසටහන් සඳහා විශේෂිත අරමුණුද පැවතිණි. උදාහරණයක් ලෙස පළාත් පාලන සහ ප්‍රාදේශීය පරිපාලන නිලධාරීන් සඳහා පවත්වන ලද වැඩසටහන් යටතේ පළාත් මට්ටමින් බලශක්ති ප්‍රතිපත්ති සංවර්ධන සහ සැලසුම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා ඔවුන්ගේ හැකියා වර්ධනය කිරිමද ඇතුලත් විය. පළාත් පාලන ආයතන වල සම්පත් යෙදවීමේ (මානව, මූල්‍ය, තාක්ෂණික, පරිපාලන ආදී) සහ සුනිත්‍ය බලශක්ති සංවර්ධන අභිමතාර්ථ සඳහා දායකවීම සඳහා ඔවුන් සවිබලගැන්වීමෙන් පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති කාර්යක්ෂමතා ($RE^3$) කලාප ලෙස නම් කිරීමේ පුළුල් අරමුණු මෙම වැඩසටහනට පැවතිණි. 2012 වර්ෂය තුලදී මෙම වැඩසටහන සඳහා මහනුවර නගර සභාව, යාපනය නගර සභාව, කල්මුනේ නගර සභාව, මැදදුම්බර ප්‍රදේශීය ලේකම් කාර්යාලය සහ අකුරණ ප්‍රදේශීය සභාව යන පළාත් පාලන ආයතන සහභාගී විය.

### විදුල්කා 2012

විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ සහයෝගීත්වයෙන් 2012 වර්ෂයේ අගෝස්තු මස 17 සිට 19 වැනි දින දක්වා විදුල්කා ජාතික බලශක්ති ප්‍රදර්ශනය තුන්වැනි වරටත් පවත්වන ලදී. නවතම බලශක්ති කාර්යක්ෂමතා තාක්ෂණික ක්‍රමවේද පිළිබඳව මෙන්ම පුනර්ජනනීය බලශක්තිය පදනම් කරගත් තාක්ෂණයන් සහ නිෂ්පාදන පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා සියළු මට්ටමේ පාරිභෝගිකයින් හට මෙමඟින් අවස්ථාව සැලසිණි. සුනිත්‍ය බලශක්ති සංවර්ධන ක්ෂේත්‍රයෙහි, සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ක්‍රියාවට නංවන ලද ජාතික වැඩසටහන් පිළිබඳව විවිධ අංශ අතර දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා ද මෙමඟින් ඉඩ ප්‍රස්ථාවක් සැලසිණි. ප්‍රදර්ශනයට සමගාමීව පැවති විදුල්කා ජාතික බලශක්ති සම්මන්ත්‍රණය බලශක්ති පර්යේෂකයින් හට ඔවුන්ගේ වැඩකටයුතු ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා උසස් මට්ටමේ සමුළුවක් වූ අතර විද්වතුන් සහ කර්මාන්තකරුවන් අතර සුනිත්‍ය බලශක්ති කතිකාවතක් සඳහා අවස්ථාවක් ද විය.


ශ්‍රී ලංකා ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මාන (SLNEEA)

**නොකඩවා තුන්වැනි වතාවටත් ශ්‍රී ලංකා ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මාන වැඩසටහන 2012 වර්ෂයේ අගෝස්තු මස පැවැත්විණි. විවිධ අංශ යටතේ විවිධ ආයතන වලින් ඉල්ලුම්පත් 31 ලැබී තිබූ අතර බොහොමයක් ඉදිරිපත් කිරීම් සම්මානය සඳහා සුදුසුකම් ලැබීය. ෆීනික්ස් ඉන්ඩස්ට්‍රීස් සමාගම සඳහා ස්වර්ණ සම්මානයද , කොග්ගල බ්‍රැන්ඩික්ස් එසෙන්ෂල්ස්, මහගෙදර හෙරිටන්ස් ආයුර්වේද, ශ්‍රී ලන්කන් එයාර්ලයින් සමාගම සහ නිට්ටඹුව හැටන් නැෂනල් බැංකුව PLC සඳහා රජත සම්මානයද ලෝඩ්ස්ටාර් (පෞද්.) සමාගම, මීදිගම ටයර් අංශය සහ ජෙට්වින් බිලූ සඳහා ලෝකඩ සම්මානය ද ප්‍රදානය කෙරිණි. සිලොන් කෝල්ඩ් ස්ටෝර්ස් PLC, ගල්කිස්ස මහ හෝටලය, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය, බණ්ඩාරවෙල හෝටලය, ද රෝයල් හෙරිටේජ් හොටෙල් (පෞද්.) සමාගම, සෙන්ට් ඇන්ඩෲස් හොටෙල් (පෞද්.) සමාගම සහ ගුවන්තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම සඳහා කුසලතා සහතිකපත් ප්‍රදානය කරන ලදී. ප්‍රොෆෙෂනල් මෙට් කන්සල්ටන්සි සර්විසස් (පෞද්.) සමාගම විශිෂ්ට බලශක්ති සේවා සමාගම ලෙස ලෝකඩ සම්මානය දිනා ගත් අතර එම කාණ්ඩයේ කුසලතා සහතික පත්‍රය**



**කර්මාන්ත සේවා කාර්යාංශය වෙත ප්‍රදානය කරන ලදී.**

**1 රූපය: සම්මාන ලාභීන් – ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මාන 2012**



# මූල්‍ය තත්ව ප්‍රකාශනය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

2012 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂ පත්‍රය

අවසන්

| | සටහන | 2012 | 2012 | 2011 ප්‍රතිප්‍රකාශිත රු. | 2011 ප්‍රතිප්‍රකාශිත රු. |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 3 | 1,355,913,508 | | 1,462,170,917 | |
| කෙරෙමින් පවතින වැඩ | 4 | 7,551,235 | | 20,277,945 | |
| ආයෝජන | 5 | 55,507,154 | 1,418,971,897 | 63,907,154 | 1,546,356,016 |
| **ජංගම වත්කම්** | | | | | |
| ලැබිය යුතු දෑ | 6 | 12,449,801 | | 7,335,256 | |
| වෙනත් ජංගම වත්කම් | 7 | 23,593,415 | | 47,959,116 | |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 8 | 159,958,726 | 196,001,942 | 68,705,192 | 123,999,564 |
| **මුළු වත්කම්** | | | 1,614,973,839 | | 1,670,355,580 |
| **සමකොටස් සහ බැරකම්** | | | | | |
| **සමකොටස්** | | | | | |
| සමුච්චිත අරමුදල | 9 | 76,268,523 | | 76,268,523 | |
| සමුච්චිත අතිරික්තය | | (16,095,714) | | (37,002,379) | |
| විලම්භිත ප්‍රදාන | 10 | 1,356,059,138 | | 1,475,043,735 | |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි අරමුදල | 11 | 142,222,496 | 1,558,454,443 | 96,855,634 | 1,611,165,512 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| ගෙවිය යුතු පාරිතෝෂික | | 6,328,608 | 6,328,608 | 5,545,677 | 5,545,677 |
| **ජංගම බැරකම්** | | | | | |
| වෙනත් ගෙවියු යුතු දෑ | 12 | 47,058,212 | | 51,290,815 | |
| කෙටි කාලීන ප්‍රතිපාදන - විගණන ගාස්තු | | 982,076 | | 632,076 | |
| ඉඩම් අත්පත්කර ගැනීම් මත තැන්පතු | | 2,150,500 | 50,190,788 | 1,721,500 | 53,644,391 |
| **මුළු සමකොටස් සහ බැරකම්** | | | 1,614,973,839 | | 1,670,355,580 |

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සඳහා සහ වෙනුවෙන්**

මුදල් ප්‍රධානී | අධ්‍යක්ෂ ජනරාල් | සභාපති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල

අවසන්

**2012 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය**

| | සටහන | 2012 | 2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | | | ප්‍රතිප්‍රකාශිත |
| ආදායම | | | |
| ව්‍යාපෘති වියදම් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන | 13 | 37,502,139 | 29,867,008 |
| ක්‍රමක්ෂිත විලම්භිත ප්‍රදාන | 14 | 161,433,593 | 102,871,812 |
| පුනරාවර්තන ප්‍රදාන | | 33,180,000 | 32,000,000 |
| වෙනත් ආදායම් | 15 | 98,848,394 | 36,336,592 |
| **මුළු ආදායම්** | | **330,964,126** | **201,075,412** |
| **වියදම්** | | | |
| ව්‍යාපෘති වියදම් | 16 | (62,473,123) | (47,187,530) |
| වැටුප් සහ දීමනා | 17 | (48,391,942) | (40,948,366) |
| ගමන් වියදම් සහ යැපීම් දීමනා | 18 | (1,416,843) | (1,967,173) |
| සැපයුම් | 19 | (6,610,976) | (5,810,022) |
| නඩත්තු වියදම් | 20 | (5,356,408) | (4,082,889) |
| කොන්ත්‍රාත් සේවා | 21 | (19,732,818) | (16,412,150) |
| ක්ෂය වියදම | 22 | (161,433,114) | (106,395,700) |
| වෙනත් පුනරාවර්තන වියදම් | 23 | (4,642,237) | (8,143,087) |
| **කාල පරිච්ඡේදය සඳහා වියදම** | | **(310,057,461)** | **(230,946,917)** |
| පසුගිය වර්ෂයේ ගැලපීම් | | - | |
| **අතිරික්තය /(හිඟය)** | | **20,906,665** | **(29,871,505)** |

## ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

## 2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| විස්තරය | සමුච්චිත අරමුදල | ශුද්ධ අතිරික්තය/හිඟය | විලම්භිත ප්‍රදාන | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල | එකතුව |
|---|---|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| **2010.12.31 දිනට ශේෂය** | **76,268,523** | **(7,508,558)** | **128,431,867** | **29,414,356** | 226,606,188 |
| 2011 වර්ෂය සඳහා වැඩිවීම/අඩුවීම | - | (29,871,505) | 1,346,611,868 | 67,441,279 | 1,384,181,642 |
| පසුගිය වර්ෂයේ ගැලපීම | | 377,684 | | | 377,684 |
| **2011.12.31 දිනට ශේෂය** | **76,268,523** | **(37,002,379)** | **1,475,043,735** | **96,855,634** | **1,611,165,513** |
| 2012 වර්ෂය සඳහා වැඩිවීම/අඩුවීම | - | 20,906,665 | (118,984,597) | 45,366,862 | (52,711,070) |
| පසුගිය වර්ෂයේ ගැලපීම | | | | | |
| **2012.12.31 දිනට ශේෂය** | **76,268,523** | **(16,095,714)** | **1,356,059,138** | **142,222,496** | **1,558,454,443** |

අංක 5 සිට 17 දක්වා පිටු වල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල ඒකාබද්ධ කොටසක් තනයි.

අවසන්

## ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

### 2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

| | 2012 | | 2011 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතු වලින් මූල්‍ය ප්‍රවාහය** | | | | |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය | 20,906,665 | | (29,871,505) | |
| පසුගිය වර්ෂයේ ගැලපීම | | | | |
| **ගැලපීම්:** | | | | |
| ක්‍රමක්ෂය ප්‍රදාන | (161,433,114) | | (102,871,812) | |
| පොළී ආදායම් | (5,782,567) | | - | |
| සේවා පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 860,127 | | 1,418,489 | |
| ක්ෂය | 161,433,114 | | 102,871,812 | |
| | 15,984,225 | | (28,453,016) | |
| වෙනත් ජංගම වත්කම් වල වැඩිවීම/අඩුවීම | 20,170,207 | | (39,482,804) | |
| ජංගම බැරකම් වල වැඩිවීම/අඩුවීම | (3,453,603) | | 43,495,297 | |
| මෙහෙයුම් වලින් උත්පාදිත මුදල් | 32,700,829 | | (24,440,523) | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ලැබීම | | 32,700,829 | | (24,440,523) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහය** | | | | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | (12,630,337) | | (1,442,842,587) | |
| කෙරෙමින් පවතින වැඩ | (10,867,523) | | (15,523,945) | |
| ආයෝජිත පොළී/FD & TB වල ආයෝජන | 13,263,516 | | 483,054 | |
| ආයෝජන ක්‍රියාකාරකම් වල යෙදවූ ශුද්ධ මුදල් | | (10,234,344) | | (1,457,883,478) |
| **මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහය** | | | | |
| විලම්භිත ප්‍රදාන | 23,497,382 | | 1,453,007,568 | |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල | 45,366,862 | | 67,441,278 | |
| සමුච්චිත අරමුදල | | | (3,523,888) | |
| පාරිතෝෂික ගෙවීම | (77,195) | | - | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වල යෙදවූ ශුද්ධ මුදල් | | 68,787,049 | | 1,516,924,958 |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම** | | 91,253,534 | | 34,600,957 |
| **කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ** | | 68,705,192 | | 34,104,235 |
| **කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ** | | 159,958,726 | | 68,705,192 |

අංක 5 සිට 17 දක්වා පිටු වල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල ඒකාබද්ධ කොටසක් තනයි.

**<u>2012.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්</u>**

## 1. සංයුක්ත තොරතුරු

### 1.1 සාමාන්‍යය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SEA) 2007 වර්ෂයේ ඔක්තෝබර් මස 01 වැනි දින ස්ථාපිත කරන ලදී. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) කාමර අංක 3G-17 හි ස්ථානගත කර ඇත.

1985 අංක 02 දරන බලශක්ති පරිවර්තන (ECF) පනත 2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත මඟින් අවලංගු කර ඇත. 2007 සැප්තැම්බර් මස 30 වැනි දිනට ECF සියළු වත්කම් සහ බැරකම් 2007 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ස්වයංක්‍රීයව SEA හි ගිණුම් වලට මාරු වී ඇත.

විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ නියෝගය පරිදි ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යටතේ පැවති ආලෝකකරණය සඳහා වන ප්‍රාදේශීය මධ්‍යස්ථානය (RCL) ලංකා විදුලිබල මණ්ඩලය වෙත මාරු කරන ලදී. ඒ අනුව RCL හි වත්කම්, බැරකම් සහ සේවකයින් 2012 වර්ෂයේ දෙසැම්බර් මස ලංවිම වෙත මාරු කරන ලදී.

### 1.2 අධිකාරියෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය; පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරිම; බලශක්ති සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම; බලශක්තිය ලබාදීමෙහි සහ තොරතුරු කළමනාකරණයෙහි සුරක්ෂිතභාවය, විශ්වාසනීයත්වය සහ පිරිවැය ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරිම සඳහා වැඩසටහන් මෙහෙයවීමට බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාමාර්ග සහ සංරක්ෂණ ක්‍රියාවට නැංවීම.

### 1.3 සේවක සංඛ්‍යාව

20121231 වැනි දිනට සේවක සංඛ්‍යාව - 100

**2.1** වැදගත් ගිණුම් ප්‍රතිපත්ති වල සාරාංශය

2.1.1 සකස් කිරීමේ පදනම අනුකූල වීමේ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව 2012 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමඟින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සකස් කර ඇත.

SLSEA හි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනමින් සකස් කර ඇත. අවශ්‍ය තැන්වලදී ගිණුම්කරණ ප්‍රතිපත්ති පසු සටහන් වල අනාවරණය කර ඇත.

**2.1.2** සංසන්දනාත්මක සංඛ්‍යා

වර්තමාන මූල්‍ය වර්ෂයෙහි වෙනස්කම් සඳහා අනුකූල වන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යා සඳහා ගැලපීම් සිදු කර ඇත.

පසුගිය වර්ෂයේ නොසළකා හැරීම්/දෝෂ නිවැරදි කිරීම සඳහා ශේෂ පත්‍රය සහ ආදායම් ප්‍රකාශනය 2009, 2010 සහ 2011 වර්ෂ සඳහා අතීතයට බලපාන අයුරින් නැවත ප්‍රකාශයට පත් කර ඇත.

| විස්තරය | **2009**<br>ගණන රු. | **2010**<br>ගණන රු. | **2011**<br>ගණන රු. |
|---|---|---|---|
| ශුද්ධ අතිරික්තයෙන් වෙනුවට වැරදි සහගත ලෙස සමුච්චිත අරමුදලින් අඩු කරනු ලැබූ විලම්භිත ආදායම සඳහා නිවැරදි කිරීම | 3,523,888 | 3,523,888 | 3,523,888 |
| 2009 වර්ෂයේ මිලදී ගත් බලශක්ති උපකරණ වල ක්ෂය නොසලකා හැරීම, දැන් ගිණුම්ගත කරනු ලැබේ. | 5,585,981 | 8,056,460 | - |

**2.2.1 -** **රජයේ ප්‍රදානයන් සඳහා ගිණුම් තැබීම සහ රජයේ සහාය අනාවරණය කිරීම.**

රජයේ ප්‍රදානයන් ප්‍රාග්ධන ප්‍රදාන සහ පුනරාවර්තන ප්‍රදාන ලෙස කාණ්ඩ දෙකකට බෙදා වෙන් කරනු ලැබේ. පුනරාවර්තන වියදම්, කාර්ය මණ්ඩල වැටුප්, ගොඩනැගිලි කුලී ආදී වියදම් පියවීම සඳහා යොදා ගනු ලැබේ. ප්‍රාග්ධන ප්‍රදාන ව්‍යාපෘති/වැඩසටහන් වියදම් සහ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා භාවිතා කරනු ලැබේ. ව්‍යාපෘති වියදම් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් වලින් සමන්විත වන බැවින් එම වියදම් ප්‍රාග්ධන ප්‍රදාන වලින් දරනු ලැබේ

වත්කමෙහි ප්‍රයෝජ්‍ය ජීව කාලය ඔස්සේ ක්‍රමානුකූල සහ තර්කාන්විත පදනමින් හඳුනාගනු ලබන රජයේ ප්‍රාග්ධන ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස සලකනු ලැබේ.

ව්‍යාපෘති වියදම් සඳහා ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන වැනි ශීර්ෂයක් යටතේ පුනරාවර්තන ව්‍යාපෘති වියදම් හා සම්බන්ධ වන ප්‍රදාන ආදායම් ප්‍රකාශනයෙහි බැරකමක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

**2.2.** **දීර්ඝ කාලීන ආයෝජන සඳහා ගිණුම් තැබීම.**

රජයේ භාණ්ඩාගාර බිල්පත් වල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත් වල ආයෝජනය කර ඇති අතර පිරිවැයට දක්වා ඇත.

**2.2.3 - ආදායම හඳුනාගැනීම**

**2.2.4 අනිශ්චිත බැරකම් සහ අනිශ්චිත වත්කම්**

2008 වර්ෂයේ මාර්තු මස 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින්ගෙන් මිලදී ගන්නා ලද විදුලි බලය සඳහා ඇස්තමේන්තුගත රු.මි. 897 ක් SLSEA විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු වේ. මෙම ගෙවීම සිදු කිරීම සඳහා මේවන විට ක්‍රමයක් නොමැති අතර ඒ සඳහා භාණ්ඩාගාර අරමුදල් හෝ සෙස් බදු හෝ පුරස්කාර තුලින් උපයාගත යුතු වේ. මේවා භාණ්ඩාගාර අනුමැතියට යටත් වේ. එබැවින් මෙය අනිශ්චිත බැරකමක් ලෙස පමණක් අනාවරණය කර ඇත.

**2.3 දේපල, පිරියත සහ උපකරණ**

**2.3.1 පිරිවැය සහ තක්සේරු කිරීම**

ස්ථාවර වත්කම්, පිරිවැය අඩුකිරීම සමුච්චිත ක්‍රමක්ෂයට දක්වා ඇත. රේඛීය ක්‍රමය භාවිතා කරමින් ස්ථාවර වත්කම් වල ක්ෂය සඳහා වෙන්කිරීම් ගණනය කර ඇත.

මාසයක කාලයක් සඳහා ක්‍රමක්ෂය පහත දක්වා ඇත:

| අයිතමය | ක්‍රමක්ෂය අනුපාතය |
|---|---|
| ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 25% |
| මෝටර් වාහන | 20% |
| ඡායාපිටපත් යන්ත්‍රය | 25% |
| පරිගණක | 33.33% |
| විදුලි භාණ්ඩ | 25% |
| පුස්තකාල පොත් | 20% |
| බලශක්ති උපකරණ | 33.33% |
| ප්‍රදර්ශන උපකරණ | 25% |
| සුළං කුළුණු | 20% |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 5% |

<u>සූර්ය බලශක්ති ව්‍යාපෘති:</u>

| | |
|---|---|
| A. සූර්ය පනේල | 5% |
| B. යකඩ ව්‍යූහ | 10% |
| C. ගොඩනැගිලි | 5% |
| D. ස්විච්විපන්න | 20% |
| E. අපවර්තක | 20% |
| F. ට්‍රාන්ස්ෆෝමර | 5% |
| G. විදුලි ඉලෙක්ට්‍රෝනික් | 33.33% |
| I. සනීපාරක්ෂක සහ ජලනල වැඩ | 5% |
| J. රැහැන් | 20% |
| K. ගෘහභාණ්ඩ සවිකිරීම් සහ කාර්යාලීය උපකරණ | 25% |
| L. මෙවලම් | 33% |
| M. යන්ත්‍රසූත්‍ර | 20% |
| H. වෙනත් | 20% |

## 2.4 බැරකම් සහ ප්‍රතිපාදන

### 2.4.1 පාරිතෝෂිත

මූල්‍ය වර්ෂයේ අවසන් මාසයේ වැටුප පදනම් කර ගනිමින් අඩ මසක වැටුප හා සමාන මුදලක් පාරිතෝෂිකයක් වශයෙන් සියළුම සේවකයින් සඳහා වෙන් කර ඇත.

### 2.4.2 EPF & ETF

අදාල නිතී සහ නියාමනයන්ට අනුව EPF & ETF සඳහා දායකවීමට සේවකයින් හිමිකම් ලබයි. EPF & ETF සඳහා SLSEA හි දායකත්වය පිළිවෙළින් 12% සහ 3% කි.

### 2.4.3 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු ප්‍රකාශයට පත් කිරීම

සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු පිළිබඳ SLSEA හි සියළුම විධායක නිලධාරීන්ගේ / කළමනාකරුවන්ගේ ප්‍රකාශන ඔවුන් විසින් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමයට සම්බන්ධිත පාර්ශවයක් වන එක් ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙක් හැර අනෙකුත් සියළු කළමනාකරුවන් 2012 වර්ෂය සඳහා අනාවරණය කිරීම පිණිස ඔවුන්ට සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු නොමැති බව ප්‍රකාශයට පත් කර ඇත.

කළමනාකරණ මණ්ඩලයේ සමාජිකයින් 14 දෙනෙකු පමණක් සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු පිළිබඳ ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. අනෙකුත් කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් විසින් ඒවා SLSEA වෙත ඉදිරිපත් කර නොමැත. ඉදිරිපත් කර ඇති සමාජිකයින් අතරින් එක් සාමාජිකයෙක් ඔහු ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ට සම්බන්ධිත පාර්ශවයක් වන බව සඳහන් කර ඇත. අනෙකුත් සාමාජිකයින් 13 දෙනා ඔවුන් හට අනාවරණය කිරීම සඳහා සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු නොමැති බව සඳහන් කර ඇත.

### 2.4.5 කළමනාකරණ මණ්ඩල අනුමැතිය

මෙම මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි මස 06 වැනි දින අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

**සටහන 3 :**

**දේපල,පිරියත සහ උපකරණ**

**ස්ථාවර වත්කම්**

| විස්තරය | 2011.12.31 දිනට ශේෂය රු. | කාලපරිච්ඡේදය තුලදී අත්පත්කර ගැනීම | 2012.12.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|
| ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 10,578,249 | 1,011,862 | 11,590,111 |
| මෝටර් වාහන | 45,811,750 | - | 45,811,750 |
| ඡායාපිටපත් යන්ත්‍රය | 1,661,391 | 302,400 | 1,963,791 |
| පරිගණක | 18,035,829 | 7,394,658 | 25,430,487 |
| විදුලි භාණ්ඩ | 218,468 | 0 | 218,468 |
| පුස්තකාල පොත් | 429,915 | 23,437 | 453,352 |
| බලශක්ති උපකරණ | 66,017,279 | 10,870,068 | 76,887,347 |
| සුළං කුළුණු සහ උපකරණ | 19,016,000 | 9,628,898 | 28,644,898 |
| සූර්ය සහ කුඩා ජල විදුලි ව්‍යාපෘති: | | | |
| A. සූර්ය පනේල | 655,143,926 | - | 655,143,926 |
| B. යකඩ ව්‍යුහ | 219,252,898 | 3,008,840 | 222,261,738 |
| C. ගොඩනැගිලි | 110,267,554 | 13,400,225 | 123,667,779 |
| D. ස්විච්පන්න | 13,973,767 | - | 13,973,767 |
| E. අපවර්තක | 78,637,410 | - | 78,637,410 |
| F. ට්‍රාන්ස්ෆෝමර | 45,753,626 | - | 45,753,626 |
| G. විදුලි ඉලෙක්ට්‍රෝනික් | 19,861,894 | 5,611,358 | 25,473,252 |
| I. සනීපාරක්ෂක සහ ජලනල සවිකිරීම් | 166,360,476 | - | 166,360,476 |
| J. රැහැන් | 100,166,611 | 57,960 | 100,224,571 |
| K. ගෘහභාණ්ඩ සවිකිරීම් සහ කාර්යාලීය උපකරණ | 2,964,429 | - | 2,964,429 |
| L. මෙවලම් | 13,977,290 | - | 13,977,290 |
| M. යන්ත්‍රසූත්‍ර | 349,895 | 3,651,480 | 4,001,375 |
| H. වෙනත් | 59,679,157 | 212,520 | 59,891,677 |
| | - | - | |
| ප්‍රදර්ශන උපකරණ | 352,853 | 2,000 | 354,853 |
| | **1,648,510,667** | **55,175,706** | **1,703,686,373** |

**ක්‍රමක්ෂය ගිණුම**

| ක්‍රමක්ෂය | ක්‍රමක්ෂය අනුපාතිකය | 2011.12.31 දිනට ශේෂය රු. | වර්ෂය සඳහා ක්‍රමක්ෂය රු. | 2012.12.31 දිනට ශේෂය රු. | ශුද්ධ පොත් අගය රු. | ශුද්ධ පොත් අගය රු. 2011 |
|---|---|---|---|---|---|---|
| ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 25 | 8,630,951 | 1,406,196 | 10,037,147 | 1,552,964 | 1,947,298 |
| මෝටර් වාහන | 20 | 32,700,604 | 7,236,969 | 39,937,573 | 5,874,177 | 13,111,146 |
| ඡායාපිටපත් යන්ත්‍රය | 25 | 1,058,514 | 312,465 | 1,370,979 | 592,812 | 602,877 |
| පරිගණක | 33.33 | 14,266,260 | 3,140,658 | 17,406,918 | 8,023,569 | 3,769,569 |
| විදුලි භාණ්ඩ | 25 | 217,785 | 683 | 218,468 | 0 | 683 |
| පුස්තකාල පොත් | 20 | 358,811 | 28,413 | 387,224 | 66,128 | 71,104 |
| බලශක්ති උපකරණ | 33.33 | 55,711,011 | 10,380,701 | 66,091,712 | 10,795,634 | 10,306,268 |
| සුළං කුළුණු සහ උපකරණ | 20 | 6,116,378 | 5,446,151 | 11,562,529 | 17,082,369 | 12,899,622 |
| සූර්ය සහ කුඩා ජල විදුලි ව්‍යාපෘති: | | | | | | |
| A. සූර්ය පනේල | 5 | 17,053,947 | 32,757,196 | 49,811,143 | 605,332,783 | |
| B. යකඩ ව්‍යුහ | 10 | 10,226,955 | 21,954,063 | 32,181,018 | 190,080,720 | |
| C. ගොඩනැගිලි | 5 | 3,858,123 | 5,577,262 | 9,435,385 | 114,232,394 | |
| D. ස්විච්පන්න | 20 | 2,603,332 | 2,794,753 | 5,398,085 | 8,575,682 | |
| E. අපවර්තක | 20 | 8,646,370 | 15,727,482 | 24,373,852 | 54,263,558 | |
| F. ට්‍රාන්ස්ෆෝමර | 5 | 1,085,415 | 2,287,681 | 3,373,096 | 42,380,530 | |
| G. විදුලි ඉලෙක්ට්‍රෝනික් | 33.33 | 4,030,300 | 6,582,389 | 10,612,689 | 14,860,563 | |
| I. සනීපාරක්ෂක සහ ජලනල සවිකිරීම් | 5 | 3,486,733 | 8,318,024 | 11,804,757 | 154,555,719 | |
| J. රැහැන් | 20 | 8,590,324 | 20,034,431 | 28,624,755 | 71,599,816 | |
| K. ගෘහභාණ්ඩ සවිකිරීම් සහ කාර්යාලීය උප | 25 | 310,656 | 741,107 | 1,051,763 | 1,912,666 | |
| L. මෙවලම් | 33.33 | 1,998,633 | 4,612,506 | 6,611,139 | 7,366,151 | |
| M. යන්ත්‍රසූත්‍ර | 20 | 48,889 | 139,816 | 188,705 | 3,812,670 | |
| H. වෙනත් | 20 | 5,003,239 | 11,939,896 | 16,943,135 | 42,948,542 | 133,466,606 |
| | | | - | | - | |
| ප්‍රදර්ශන උපකරණ | 25 | 336,519 | 14,272 | 350,791 | 4,061 | 16,334 |
| | | **186,339,749** | **161,433,116** | **347,772,865** | **1,355,913,508** | **176,191,507** |

සටහන 4 : කෙරෙමින් පවතින වැඩ

| | 2012.12.31 | 2001.12.31 | 2010.12.31 |
|---|---|---|---|
| පුනර්ජනනීය බලශක්ති ඇගයීම | 2,377,000 | 2,377,000 | 11,885,000 |
| හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානය | 3,517,591 | - | 46,693,991 |
| ඉඳුරුව කුඩා ජල විදුලි ව්‍යාපෘතිය | 1,656,644 | 15,523,945 | |
| බලන්ගොඩ සුළං කුළුණ | - | 2,377,000 | |
| | 7,551,235 | 20,277,945 | 58,578,991 |

සටහන 5 : ආයෝජන

ස්ථාවර තැන්පතු (බොරැල්ල ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත් කර ඇති)

| අයෝජනය කරන ලද දිනය | කල්පිරෙන දිනය | ආයෝජන අනුපාතිකය | තැන්පතු ලියාපදිංචි කිරීමේ අංකය | 2012.12.31 දිනට තැන්පතු | 2011.12.31 දිනට තැන්පතු |
|---|---|---|---|---|---|
| 2011.09.21 | | | 2-0061-05-10246 | - | 1,200,000 |
| 21.09.2011. | | | 2-0061-05-10238 | - | 1,200,000 |
| 2011.09.21 | | | 2-0061-05-10220 | - | 1,200,000 |
| 2011.09.21 | | | 2-0061-05-10360 | - | 1,200,000 |
| 2011.09.21 | | | 2-0061-05-10394 | - | 1,200,000 |
| 2011.09.21 | | | 2-0061-05-10467 | - | 1,200,000 |
| 2011.09.21 | | | 2-0061-05-10459 | | 1,200,000 |
| 2011.09.21 | 2013.09.21 | 12.5% | 2-0061-05-10416 | 1,200,000 | 1,200,000 |
| 2011.09.21 | 2013.09.22 | 12.5% | 2-0061-05-10432 | 1,200,000 | 1,200,000 |
| 2011.09.21 | 2013.09.23 | 12.5% | 2-0061-05-10408 | 1,200,000 | 1,200,000 |
| 2011.09.21 | 2013.09.24 | 12.5% | 2-0061-05-10343 | 1,200,000 | 1,200,000 |
| 2011.09.21 | 2013.09.25 | 12.5% | 2-0061-05-10335 | 1,200,000 | 1,200,000 |
| 2011.09.21 | 2013.09.26 | 12.5% | 2-0061-05-10378 | 1,200,000 | 1,200,000 |
| 2011.09.21 | 2013.09.27 | 12.5% | 2-0061-05-10386 | 1,200,000 | 1,200,000 |
| 2011.09.21 | 2013.09.28 | 12.5% | 2-0061-05-10327 | 1,200,000 | 1,200,000 |
| 2011.09.21 | 2013.09.29 | 12.5% | 2-0061-05-10319 | 1,200,000 | 1,200,000 |
| 2011.09.21 | 2013.09.30 | 12.5% | 2-0061-05-10297 | 1,200,000 | 1,200,000 |
| 2011.09.21 | 2013.09.31 | 12.5% | 2-0061-05-10289 | 1,200,000 | 1,200,000 |
| 2011.09.21 | 2013.09.32 | 12.5% | 2-0061-05-102262 | 1,200,000 | 1,200,000 |
| 2011.09.21 | 2013.09.33 | 12.5% | 2-0061-05-10254 | 1,200,000 | 1,200,000 |
| 2011.09.21 | 2013.09.34 | 12.5% | 2-0061-04-12376 | 450,000 | 450,000 |
| 2011.09.21 | 2013.09.35 | 12.5% | 2-0061-03-09834 | 2,800,000 | 2,800,000 |
| | | | | 18,850,000 | 27,250,000 |

භාණ්ඩාගාර බිල්පත් - මහජන බැංකුවේ ප්‍රධාන ශාඛාව

| අයෝජනය කරන ලද දිනය | කල්පිරෙන දිනය | ආයෝජන අනුපාතිකය | තැන්පතු ලියාපදිංචි කිරීමේ අංකය | 2012.12.31 දිනට තැන්පත් | 2011.12.31 දිනට තැන්පත් |
|---|---|---|---|---|---|
| 2011.01.18 | 2013.01.17 | | LKB00615C156 | 12,489,626 | 12,489,626 |
| 2011.07.09 | 2013.07.11 | | LKB00314J011 | 24,167,528 | 24,167,528 |
| | | | | 36,657,154 | 36,657,154 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **මුළු එකතුව** | | | | 55,507,154 | 63,907,154 |

**සටහන 6 - ලැබිය යුතු දේ**

ස්ථාවර තැන්පත් වලින් ලැබිය යුත් පොළී

| අයෝජනය කරන ලද දිනය | කල්පිරෙන දිනය | ආයෝජන අනුපාතිකය | 2012.12.31 දිනට තැන්පතු | 2012 සඳහා ලැබිය යුතු රු. | 2011 සඳහා ලැබිය යුතු රු. |
|---|---|---|---|---|---|
| 2011.09.21 | | | | | 28,504 |
| 2011.09.22 | | | | | 28,504 |
| 2011.09.23 | | | | | 28,504 |
| 2011.09.24 | | | | | 28,504 |
| 2011.09.25 | | | | | 28,504 |
| 2011.09.26 | | | | | 28,504 |
| 2011.09.27 | | | | | 28,504 |
| 2011.09.28 | 2013.09.21 | 12.5% | 1,200,000 | 43,274.93 | 28,504 |
| 2011.09.29 | 2013.09.22 | 12.5% | 1,200,000 | 43,274.93 | 28,504 |
| 2011.09.30 | 2013.09.23 | 12.5% | 1,200,000 | 43,274.93 | 28,504 |
| 2011.09.31 | 2013.09.24 | 12.5% | 1,200,000 | 43,274.93 | 28,504 |
| 2011.09.32 | 2013.09.25 | 12.5% | 1,200,000 | 43,274.93 | 28,504 |
| 2011.09.33 | 2013.09.26 | 12.5% | 1,200,000 | 43,274.93 | 28,504 |
| 2011.09.34 | 2013.09.27 | 12.5% | 1,200,000 | 43,274.93 | 28,504 |
| 2011.09.35 | 2013.09.28 | 12.5% | 1,200,000 | 43,274.93 | 28,504 |
| 2011.09.36 | 2013.09.29 | 12.5% | 1,200,000 | 43,274.93 | 28,504 |
| 2011.09.37 | 2013.09.30 | 12.5% | 1,200,000 | 43,274.93 | 28,504 |
| 2011.09.38 | 2013.09.31 | 12.5% | 1,200,000 | 43,274.93 | 28,504 |
| 2011.09.39 | 2013.09.32 | 12.5% | 1,200,000 | 43,274.93 | 28,504 |
| 2011.09.40 | 2013.09.33 | 12.5% | 1,200,000 | 43,274.93 | 28,504 |
| 2011.09.41 | 2013.09.34 | 12.5% | 450,000 | 16,228.10 | 10,270 |
| 2011.09.42 | 2013.09.35 | 12.5% | 2,800,000 | 100,974.83 | 57,381 |
| | | | 18,850,000 | 679,777 | **637,731** |

භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබිය යුතු පොළී

| අයෝජනය කරන ලද දිනය | කල්පිරෙන දිනය | ආයෝජන අනුපාතිකය | 2012.12.31 දිනට තැන්පතු | 2012 සඳහා ලැබිය යුතු රු. | 2011 සඳහා ලැබිය යුතු රු. |
|---|---|---|---|---|---|
| 18.01.2011. | 17.01.2013. | | 12,489,626 | 1,050,908 | 804,264 |
| 09.07.2011. | 11.07.2013 | | 24,167,528 | 1,448,396 | 818,036 |
| | | | **36,657,154** | 2,499,304 | **1,622,300** |

**ලැබිය යුතු ආදායම - බලශක්ති උපකරණ කුලියට දීම**

| | **31.12.2012.** | **31.12.2011.** | **31.12.2010.** |
|---|---|---|---|
| බාන්ඩස් පිනිෂින්ග් සමාගම - 2005 | 4,850 | 4,850 | 4,850 |
| BMI හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගම - 2005 | 7,200 | 7,200 | 7,200 |
| හේලිස් ඉන්ඩස්ට්‍රියල් සොලූෂන්ස් -2005 | 500 | 500 | 500 |
| එනර්ෆැබ (පෞද්.) සමාගම -2006 | 3,750 | 3,750 | 3,750 |
| ඇක්සස් එනර්ජි සොලූෂන්ස් | 500 | 500 | 500 |
| ඇක්සස් එනර්ජි සොලූෂන්ස් | 500 | 500 | 500 |
| බ්‍රැන්ඩික්ස් | 2,650 | 250 | 250 |
| DIMO | 1,600 | | |
| එනර්ජි සොලූෂන්ස් සමාගම | 5,750 | | |
| නැෂනල් ක්ලීනර් ප්‍රොඩක්ෂන් සෙන්ටර් | 750 | | |
| MAS ඇක්ටිව් | 2,400 | | |
| ඉංජිනියරින් ඩිසයින් සෙන්ටර් | 5,000 | | |
| ග්ලයිඩ (පෞද්.) සමාගම | 150 | | |
| SLEMA | 250 | | |
| | 35,850 | 17,550 | 17,550 |
| ලැබිය යුතු දෑ -විදුල්කා ආදායම | 472,175 | | |
| විදුලි උත්පාදන -ඉදුරාන | 80,270 | | |
| පුහුණු වැඩසටහන | | | |
| විදුලි උත්පාදනය -හම්බන්තොට | 8,682,425 | | |
| පසුගිය වර්ෂයේ ගැලපීම | | 5,057,675 | |
| | **9,270,720** | **5,075,225** | **17,550** |
| **මුළු එකතුව** | 12,449,801 | 7,335,256 | **2,760,635** |

| | 2012.12.31 | 2011.12.31 | 2010.12.31 |
|---|---|---|---|
| **සටහන 7: වෙනත් ජංගම වත්කම්** | | | |
| **අත්තිකාරම්** | | | |
| CFL ණය | 194,673 | 194,673 | 194,673 |
| බලශක්ති අරමුදලින් අධිකාරියේ අරමුදලට ලැබීම් | 7,269,950 | | |
| අධිකාරියේ අරමුදලින් බලශක්ති අරමුදලට ලැබීම් | | 30,000,000 | |
| විදුලිබල සහ බලශක්ති අමාත්‍යවරයා විසින් ණයට ගත් | 8,000,000 | | |
| ලංවිම ලැබීම් | | 9,912,981 | |
| උත්සව අත්තිකාරම් | | | 59,000 |
| වෛද්‍ය රක්ෂණ | 500 | 500 | 500 |
| අත්තිකාරම් ගිණුම | | 22,500 | 504,815 |
| ජාතික ජල සම්පත් මණ්ඩලය | | | 240,000 |
| අත්තිකාරම්, තැන්පතු, ඉන්ධන ආදී | 136,500 | 111,500 | 111,500 |
| විශේෂ අත්තිකාරම් | | | 77,500 |
| ආපදා ණය | | | 7,227,549 |
| ලංවිම තැන්පතු - හම්බන්තොට | 52,000 | 52,000 | 52,000 |
| ලංවිම තැන්පතු- ඉදුරාන | 62,500 | | |
| දුරකථන තැන්පතු | 8,775 | 8,775 | 8,775 |
| SWRDB ජාතික අනුස්මරණ අරමුදල- තැන්පතු | 240,000 | | |
| සේවක පුහුණු වැඩසටහන් අත්තිකාරම් | 80,000 | | |
| වැඩසටහන් සඳහා අත්තිකාරම් | 161,185 | | |
| | **16,206,083** | **40,302,929** | **8,476,312** |
| **සක්‍රිය අරමුදල** | | | |
| ආපදා ණය | 7,314,344 | 7,592,687 | |
| විශේෂ අත්තිකාරම් | 500 | 500 | |
| උත්සව අත්තිකාරම් | 72,489 | 63,000 | |
| | **7,387,332** | **7,656,187** | |
| | 23,593,415 | 47,959,116 | |

| | 2012.12.31 | 2011.12.31 | 2010.12.31 |
|---|---|---|---|
| **සටහන 8: මුදල සහ මුදල් හා සමාන දෑ** | | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව - බොරැල්ල | 149,942,180 | 66,981,167 | 29,540,089 |
| මහජන බැංකුව-SEA-078-1-001-8-8-503576 | 5,798,073 | 615,197 | 3,977,368 |
| මහජන බැංකුව-SEA-078-1-002-7-8-503576 | 3,082,245 | 537,860 | 31,868 |
| ලංකා බැංකුව-ටොරින්ටන් | 1,136,228 | 570,968 | 554,910 |
| | **159,958,726** | **68,705,192** | **34,104,235** |

**සටහන 9 : සමුච්චිත අරමුදල**

2007 ඔක්තෝබර් 01 දින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට (SLSEA) මාරු කරන ලද බලශක්ති සංරක්ෂණ අරමුදලේ (ECF) සමුච්චිත අරමුදල සැප්තැම්බර් 30 වැනි දිනට එය පහත දෑ වලින් සමන්විත වේ :

| | 2012.12.31 | 2011.12.31 | 2010.12.31 |
|---|---|---|---|
| 2007 සැප්තැම්බර් 30 දිනට සමුච්චිත අරමුදල | 61,244,579 | 61,244,579 | 50,672,915 |
| ආරම්භක ප්‍රාග්ධනය | 5,000,000 | 5,000,000 | 5,000,000 |
| විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය- ප්‍රාග්ධන ප්‍රදාන | 5,761,145 | 5,761,145 | 5,761,145 |
| UNDP ප්‍රාග්ධන ප්‍රදාන | 3,612,560 | 3,612,560 | 3,612,560 |
| ආහාර සහ කෘෂිකර්ම සංවිධානය - දායක ප්‍රදාන | 650,239 | 650,239 | 650,239 |
| එකතුව | 76,268,523 | 76,268,523 | 65,696,859 |

| | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| **සටහන 10: විලම්භිත ප්‍රදාන** | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන 2008 | 33,687,060 | 33,687,060 | 33,687,060 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2009 | 11,705,408 | 11,705,408 | 11,705,408 |
| විදේශ ප්‍රදාන 2009 - ජපන් | 24,165,380 | 24,169,380 | 24,169,380 |
| ප්‍රාග්ධන ප්‍රදාන 2010 -හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානය (WIP) | 46,693,991 | 46,693,991 | 46,693,991 |
| -ක්‍රමක්ෂිත ප්‍රාග්ධන ප්‍රදාන | 10,563,444 | 10,563,444 | 10,563,444 |
| විදේශ ප්‍රදාන 2010-ජපන් | 11,419,569 | 11,415,569 | 11,419,569 |
| ප්‍රාග්ධන ප්‍රධාන 2011-ඉඳුරාන කුඩා ජලවිදුලි ව්‍යාපෘතිය (WIP) | 15,523,945 | 15,523,945 | |
| -ක්‍රමක්ෂිත ප්‍රාග්ධන ප්‍රදාන - ඉඳුරාන MHP | 68,548,216 | 68,548,216 | |
| විදේශ ප්‍රදාන 2011-ජපන් | 1,155,016,402 | 1,155,016,402 | |
| - කොරියානු | 191,097,075 | 187,228,286 | |
| බිලම්භිත ප්‍රදාන -විදේශ ආධාර -2012 -ADB | 15,082,346 | | |
| භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන-2012 | 23,497,861 | | |
| **අඩුකලා:** | | | |
| -ක්‍රමක්ෂය-2012 | (161,433,593) | | |
| -ක්‍රමක්ෂය-2011 | (63,289,946) | (67,095,136) | |
| - පසුගිය වර්ෂ සඳහා ක්‍රමක්ෂය | (26,218,020) | (22,412,830) | (9,806,985) |
| | **1,356,059,138** | **1,475,043,735** | **128,431,867** |

**සටහන 11:**

| | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල** | | | |
| RE ආදායම | 130,426,630 | 74,350,910 | 25,720,450 |
| උපකරණ කුලියට දීම සහ බලශක්ති විගණන | 10,769,803 | 6,519,206 | 3,693,906 |
| ඉතිරිකිරීම් ගිණුමේ පොලිය - NSB | 7,026,063 | 1,271,298 | |
| ජනමාධ්‍ය මගින් සිදුකල දැනුවත්කිරීම් සඳහා ලබාගත් | (6,000,000) | | |
| | **142,222,496** | **82,141,414** | **29,414,356** |

**සටහන 12: ගෙවිය යුතු වෙනත්**

| | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| සුනිත්‍ය බලශක්ති අරමුදල | | 30,000,000 | |
| අධිකාරියෙහි අරමුදල | 7,269,950 | | |
| ස්විච් ඒෂියා පාලන ගිණුම | 3,051,737 | 507,352 | |
| විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය | 500 | 500 | 500 |
| උපචිත වියදම් | 29,294,019 | 16,303,819 | 4,657,611 |
| ***ණයහිමියන්*** | | | |
| සුනිත්‍ය බලශක්ති-ඉ නෙට් සොලූෂන්ස් (පෞද්.) සමාගම | 1,667,500 | 1,667,500 | 1,667,500 |
| බලශක්ති උපකරණ අත්පත් කර ගැනීම | | | |
| -ඉ නෙට් සොලූෂන්ස් (පෞද්.) සමාගම | 326,025 | 326,025 | 326,025 |
| රඳවාගැනීම් | 3,634,360 | 1,744,883 | |
| නාරාහේන්පිට ජාතික පොළ | 99,405 | 209,545 | |
| ***විවිධ ණය හිමියන්*** | | | |
| ශ්‍රී ලංකා රේගුව | 310,748 | 310,748 | 310,748 |
| සුභසාධක සංගමය SEA | 442 | 442 | 442 |
| බැටරි තැන්පතු | | | |
| ගෙවිය යුතු විවිධ | 984,269 | | |
| ***ආපසු ගෙවිය යුතු තැන්පතු*** | | | |
| ඉ නෙට් සොලූෂන්ස් (පෞද්.) සමාගම | 10,000 | | 150,000 |
| ENL කන්සල්ටන්ට් | 150,000 | 150,000 | 10,000 |
| ඉ නෙට් සොලූෂන්ස් (පෞද්.) සමාගම | | 10,000 | |
| සිග්මා ටෙක්නොලෝජීස් | 10,000 | 10,000 | 10,000 |
| රෙන්කෝ රිනීවබල් ඒනර්ජි (පෞද්.) සමාගම | 30,000 | 30,000 | 30,000 |
| ගාමිණී සේනානායක | - | 20,000 | |
| විදුල්කා ප්‍රදර්ශනය | 9,256 | | |
| වාහන බැහැරකිරීමේ ටෙන්ඩරය | 156,000 | | |
| ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව | 54,000 | | |
| | **47,058,212** | **51,290,814** | **7,162,826** |

| | 2012.12.31 | 2011.12.31 | 2010.12.31 |
|---|---|---|---|
| **සටහන 13 : ව්‍යාපෘති වියදම් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන** | | | |
| භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධන ප්‍රදාන | 61,000,000 | 135,610,000 | 135,500,000 |
| FR 295 (1) යටතේ මාරු ගෙවීම් | | 1,500,000 | 5,852,472 |
| අඩුකලා: | | | |
| හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානය | - | 89,727,504 | 46,693,991 |
| කෙරෙමින් පවතින වැඩ | 10,867,523 | 15,523,945 | |
| ප්‍රවර්තන වර්ෂය තුලදී අත්පත් කර ගන්නා ලද ප්‍රාග්ධන වත්කම් | 12,630,338 | 1,991,543 | 14,966,796 |
| | **37,502,139** | **29,867,008** | **79,691,685** |
| **සටහන 14 : ක්‍රමක්ෂිත විලම්භිත ප්‍රදාන** | | | |
| ප්‍රවර්තන වර්ෂය සඳහා ක්‍රමක්ෂය | 161,433,593 | 66,082,128 | 4,403,352 |
| පසුගිය වර්ෂය සඳහා ක්‍රමක්ෂය | | 40,313,572 | 20,378,649 |
| | **161,433,593** | **106,395,700** | **24,782,001** |
| **සටහන 15 : වෙනත් ආදායම්** | | | |
| බලශක්ති බලපත්‍ර ගාස්තු | **30,269,950** | 14,714,220 | |
| ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල පොළිය | 5,782,567 | 5,128,721 | 6,976,570 |
| SAARC බලශක්ති කේන්ද්‍රය | 528,917 | 383,388 | |
| ආපදා ණය පොළිය | 294,114 | 310,964 | 308,985 |
| විශේෂ අත්තිකාරම් පොළිය | 2,293 | 1,481 | 1,301 |
| විදුලි උත්පාදනයෙන් ලත් ආදායම - හම්බන්තොට | 37,278,565 | 16,577,905 | |
| විදුලි උත්පාදනයෙන් ලත් ආදායම - ඉදුරාන | 80,270 | | |
| විදුල්කා ප්‍රදර්ශනය (අනුග්‍රාහකත්වය) | 9,707,415 | 8,271,034 | 10,019,391 |
| ස්වීච් ඒෂියා වැඩසටහන | - | 467,753 | 1,040,100 |
| බලශක්ති කළමනාකරුවන් බලගැන්වීම | 1,639,300 | | |
| වෙනත් ආදායම් | 269,692 | 82,679 | 349,952 |
| බලශක්ති අරමුලෙන් ලත් ආදායම | 6,000,000 | | |
| ආලෝකකරණය සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 6,995,311 | 54,992 | |
| පසුගිය වර්ෂයේ ගැලපීම් | | 5,057,675 | |
| | **98,848,394** | **51,050,812** | **29,059,775** |
| **සටහන 16 :ව්‍යාපෘති වියදම්** | | | |
| **පුනර්ජනනීය බලශක්ති** | | | |
| සුළං විභව අතිරික්තයෙන් හයිඩ්‍රජන් - ප්‍රවාහන යෙදවුම | | | |
| විදුලි වාහන තාක්ෂණ සංවර්ධනය | 680 | 13,513 | |
| වෙළඳපොළ අපද්‍රව්‍යවලින් ජීව වායු උත්පාදනය කිරීමේ ප්‍රදර්ශක ව්‍යාපෘතිය | 5,738 | 2,000 | |
| ජෛව ඉන්ධන සඳහා ප්‍රමිත සකස් කිරීම | | | |
| කාර්යක්ෂම දර උඳුන් ප්‍රවර්ධනය කිරීම | 228,285 | | |
| ශ්‍රී ලංකාවේ සංකීර්ණ භූමි භාග සඳහා ගැළපෙන කුඩා පරිමාණයේ WECS සංවර්ධනය කිරීම | | 2,868,775 | |
| දත්ත විකිණීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම | | | |
| CDM ලියකියවිලි සකස් කිරීම සඳහා පෞද්ගලික අංශයට සහාය වීම | | 12,518 | |

| | 31.12.2012. | 31.12.2011. |
|---|---|---|
| සියලු පැරණි සහ පවතින සුළං මිනුම් ස්ථාන ආවරණය කරමින් විස්තීර්ණ සුළං දත්ත සමුදායක් සකස් කිරීම | | 5,000 |
| එක් එක් සම්පත් වර්ගය සඳහා පුනර්ජනනීය බලශක්ති සම්පත් සිතියම් සකස් කිරීම සහ ඇස්තමේන්තුගත RE ව්‍යූහය පිළිබඳව වාර්තා කිරීම | 1,460,244 | 481,303 |
| RE හි උපරිම විනිවිද යෑමේ මට්ටම නිශ්චය කිරීම | | |
| බලශක්ති වන වගා දිරි ගැන්වීම සහ ජෛව ස්කන්ධ කලාප 1ක් ස්ථාපිත කිරීම | 1,165 | |
| ශ්‍රී ලංකාවේ තෝරා ගත් ස්ථානයන්හි සම්බන්ධීත චන්ද්‍රිකා කුළුණු සමඟින් දීර්ඝ කාලීන සුළං/සූර්ය මිනුම් ස්ථාන 10ක් සහ උතුරු පළාත් ආවරණය කරමින් අමතර ස්ථාන 3ක් ස්ථාපිත කිරීම, මුහුදු රළ බලශක්ති මිනුම් ආරම්භ කිරීම | | 332,840 |
| දීර්ඝ කාලීන සුළං/සූර්ය මිනුම් ස්ථාන 10ක් ස්ථාපිත කිරීම, උතුරු පළාතේ සුළං මිනුම් ස්ථාන 3ක් ස්ථාපිත කිරීම, මුහුදු රළ බලශක්ති සම්පත් ඇගයීමක් ආරම්භ කිරීම | 414,647 | |
| යම් කිසි සම්පත් ස්ථානයක විභවය සම්පූර්ණයෙන්ම පරිභෝජනය කිරීම සඳහා නියාමනයන්ට සංශෝධන සිදු කිරීම | 15,755 | 3,440 |
| ජාල සම්බන්ධිත සූර්ය විදුලිබල උත්පාදනය සඳහා අංග සම්පූර්ණ බලශක්ති උද්‍යානයක් ස්ථාපිත කිරීම | 7,102,263 | |
| ජාල සම්බන්ධිත මෙ.වො. 100 ක සුළං ගොවිපොළක් සඳහා අංග සම්පූර්ණ බලශක්ති උද්‍යානයක් ස්ථාපිත කිරීම | 150,580 | 14,851 |
| ජනාධිපති කාර්ය සාධන බලකා වාර්තාවෙහි දක්වා ඇති පරිදි ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා මේ වන විටත් යෝජිත නව ක්‍රමවේදය වලංගු කිරීම | 67,256 | |
| ජාතික ප්‍රමුඛතාවක් ලෙස NCRE කර්මාන්තය සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වෙනත් අදාළ ආයතන සමඟ කටයුතු කිරීම | 933,034 | 2,000 |
| ඉඩම් ගැටලු සම්බන්ධයෙන් සේවාවන් ලබා දීම සඳහා SEA තුළ මූලික සම්බන්ධතා ස්ථාපිත කිරීම | 489,092 | |
| ව්‍යාපෘති අනුමත කිරීම හා සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම | | 114,969 |
| පුනර්ජනනීය බලශක්ති සම්පත් වෙන් කිරීම | 1,031,084 | 310,376 |
| ආරාවුල් නිරාකරණය | | |
| RE ව්‍යාපෘතිවල බලශක්ති අංශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම | | 720,127 |
| බලශක්ති අංශ ආයෝජන ප්‍රවර්ධනය (පෞද්ගලික අංශයට පහසුකම් සැපයීම) | 186,623 | |
| GIS රටවල ජල විදුලි බලයෙහි සම්පූර්ණ ආර්ථික විභවය සාක්ෂාත් කර ගැනීම | 8,925 | |
| ජාලයෙන් පිටත යෙදවුම් සඳහා යොදා ගත හැකි ප්‍රදේශ සහ එවැනි ප්‍රදේශ සඳහා පවතින සම්පත් විකල්ප හඳුනා ගැනීම | | 6,670 |
| ජාලයෙන් පිටත විදුලිබලය සැපයීමේ අවස්ථාව භාවිත කරමින් ගම්මාන 10ක් සඳහා විදුලිය ලබා දීම | 6,545,905 | |
| RE කළඹ සකසා අවසන් කිරීම සහ විවිධ RE අවස්ථාවන් සඳහා මූල්‍ය බලපෑම අධ්‍යයනය කිරීම | | |
| තෝරා ගත් ස්ථානයන්හි RE ව්‍යාපෘතිවල පශ්චාත් ස්ථාපිත ප්‍රගති අධීක්ෂණය සහ බලපෑම ඇගයීම | 7,990 | |
| ශ්‍රී ලංකා බලශක්ති තුලනය | 1,554,677 | |
| | 20,203,943 | 4,888,382 |

**බලශක්ති කළමනාකරණය**

| | 31.12.2012. | 31.12.2011. |
|---|---|---|
| තොග බලශක්ති පරිභෝජන ආයතනවල ක්‍රමානුකූල බලශක්ති ප්‍රවේශයන් සඳහා ක්‍රියා පිළිවෙළ | 1,554,199 | 92,378 |
| බලශක්ති නාමකරණ වැඩසටහන | 207,661 | 98,648 |
| විද්‍යාගාර පහසුකම් ස්ථාපිත කිරීම (ADB සහාය තුළින්) | | |
| UDA ගොඩනැගිලි අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලියට, විමර්ශන අත්පොත් තුළට සංග්‍රහය අන්තර්ගත කිරීම සහ සංග්‍රහය සමාලෝචනය කිරීම | 19,800 | 376,188 |
| මෝටර් පරීක්ෂා කිරීමේ පහසුකම් ස්ථාපිත කිරීම | 250,700 | |
| අංශ විශේෂිත වැඩසටහන් | 57,965 | 117,500 |

| | 31.12.2012. | 31.12.2011. | |
|---|---|---|---|
| E2 වෙළඳ සැල ස්ථාපිත කිරීම | | 75,713 | |
| E2 කලාප ස්ථාපිත කිරීම | | 242,626 | |
| වීජී ලාම්පු කේතය | | | |
| උපකරණ බැංකුව | 63,170 | 82,347 | |
| රජයේ ආයතනවල බලශක්ති විගණනය | 31,514 | | |
| ESCO සවි බල ගැන්වීම | 671,904 | 10,080 | |
| බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ පහසුකම | | | |
| ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ හඳුන්වා දීම | | 833,329 | |
| ප්‍රවාහන බලශක්ති ප්‍රතිපත්තිය / ඉන්ධන පිරිමැසුම් ප්‍රමිත සකස් කිරීම | 57,510 | | |
| මාධ්‍ය තුළින් දැනුවත් කිරීමේ වැඩසටහන් | 5,325,141 | 2,462,150 | |
| විදුල්කා බලශක්ති සතිය | 9,554,421 | 14,123,433 | |
| දැයට කිරුළ | 2,267,449 | 95,056 | |
| මුද්‍රණ සහ ප්‍රකාශන | 3,533,181 | 1,897,573 | |
| ශ්‍රී ලංකා ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මාන | 3,767,879 | 528,732 | |
| පාසල් ළමුන් සහ කාර්යාල කාර්ය මණ්ඩල සඳහා පුහුණු කිරීමේ වැඩසටහන් | 2,434,820 | 870,198 | |
| සම-උත්පාදනය හඳුන්වා දීම | | 267,515 | |
| වෙබ් අඩවිය නඩත්තු කිරීම | 74,361 | | |
| මීනුම් ලකුණු ස්ථාපිත කිරීම | 482,000 | | |
| ත්‍රි උත්පාදන තාප ගබඩාකරණය පිළිබඳ අධ්‍යයනය සහ උපකරණ පිළිබඳ දත්ත සමුදායක් පිහිටුවීම | 1,120 | | |
| E2 වෙළඳ සැල ස්ථාපිත කිරීම | 67,012 | | |
| E2 කලාප ස්ථාපිත කිරීම | 889 | | |
| සුළං උපකරණ අළුත්වැඩියා සහ නඩත්තු කිරීම | 124,856 | | |
| ආලෝකකරණය සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 11,721,628 | 20,125,682 | |
| | 42,269,180 | 42,299,148 | |
| | 62,473,123 | 47,187,530 | 83,360,030 |
| **පුනරාවර්තන වියදම්** | | | |
| **සටහන 17: වැටුප් සහ දීමනා** | | | |
| කාර්ය මණ්ඩලය සඳහා වැටුප් | 33,474,859 | 25,683,097 | 21,673,786 |
| ජීවන වියදම් දීමනාව | 5,986,013 | 5,320,787 | 4,441,267 |
| කාර්ය මණ්ඩලය සඳහා දීමනා | | 1,833,677 | 5,688,847 |
| E.P.F. 12% | 4,233,838 | 3,533,328 | 3,187,003 |
| E.T.F. 3 % | 1,047,061 | 870,477 | 721,854 |
| අතිකාල සහ නිවාඩු දින වැටුප් | 2,790,044 | 2,243,473 | 2,068,694 |
| පාරිතෝෂික | 860,127 | 1,463,527 | 615,990 |
| වන්දි ගෙවීම් | | | |
| | 48,391,942 | 40,948,366 | 38,422,078 |

| | 31.12.2012. | 31.12.2011. | |
|---|---|---|---|
| **සටහන 18: ගමන් වියදම් සහ යැපීම්** | | | |
| ගමන් වියදම් - දේශීය | 864,889 | 710,126 | 695,853 |
| ගමන් වියදම් -විදේශ | 551,955 | 1,257,047 | 1,095,174 |
| | 1,416,843 | 1,967,173 | 1,791,027 |
| **සටහන 19: සැපයුම්** | | | |
| මුද්‍රණ, ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 2,247,951 | 1,954,678 | 1,383,319 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 4,279,789 | 3,785,964 | 1,965,269 |
| වෙනත්-පුවත්පත් සහ විවිධ සේවා | 83,236 | 69,380 | 76,145 |
| | 6,610,976 | 5,810,022 | 3,424,733 |
| **සටහන 20: නඩත්තු වියදම්** | | | |
| වාහන නඩත්තු සහ රක්ෂණ සහ බලපත්‍ර ගාස්තු | 5,027,580 | 3,197,983 | 3,704,665 |
| කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම | 328,828 | 884,906 | 283,286 |
| | 5,356,408 | 4,082,889 | 3,987,951 |
| **සටහන 21: කොන්ත්‍රාත් සේවා** | | | |
| කාර්යාල කුලී සහ බදු ගාස්තු | 17,467,060 | 14,554,873 | 13,846,924 |
| තැපැල් සහ විදුලි සංදේශ ගාස්තු | 1,858,127 | 1,507,277 | 1,512,299 |
| ප්‍රවාහන | 57,630 | | 135,589 |
| විගණන ගාස්තු | 350,000 | 350,000 | 350,000 |
| | 19,732,818 | 16,412,150 | 15,844,812 |
| **සටහන 22: ක්‍රමක්ෂය වියදම්** | | | |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 1,406,196 | 1,934,645 | 1,767,878 |
| මෝටර් වාහන | 7,236,969 | 8,158,750 | 9,193,750 |
| ඡායා පිටපත් යන්ත්‍රය | 312,465 | 310,732 | 222,813 |
| පරිගණක | 3,140,658 | 4,514,009 | 4,383,189 |
| විදුලි භාණ්ඩ | 683 | 2,738 | 2,738 |
| පුස්තකාල පොත් | 28,413 | 26,166 | 12,817 |
| බලශක්ති උපකරණ | 10,380,701 | 20,972,481 | 6,587,700 |
| සුළං කුළුණු සහ උපකරණ | 5,446,151 | 3,519,262 | 2,597,116 |
| හම්බන්තොට බලශක්ති උද්‍යානය | 133,466,606 | 66,942,916 | |
| ප්‍රදර්ශන උපකරණ | 14,272 | 14,000 | 14,000 |
| | 161,433,114 | 106,395,699 | 24,782,000 |
| **සටහන 23: වෙනත් පුනරාවර්තන වියදම්** | | | |
| කාර්යාලීය සහ වෙනත් විවිධ වියදම් | 3,036,643 | 616,866 | 740,646 |
| පරිවර්තන ගාස්තු | 65,406 | 17,855 | 59,183 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ දීමනා | 718,000 | 472,000 | 146,000 |
| ආහාරපාන ගාස්තු | 339,630 | 224,146 | 191,414 |
| දේශීය පුහුණු වැඩසටහන | 482,558 | 434,817 | 457,810 |
| බැංකු ගාස්තු | | | 42,228 |
| විදුල්කා සහ මහජන දැනුවත් කිරීම | | 6,377,403 | |
| | 4,642,237 | 8,143,087 | 1,637,281 |

**20xx/12/31 දිනට අතීතයට බලපාන පරිදි ප්‍රතිප්‍රකාශිත ශේෂ පත්‍ර වත්කම්**

| | 2010(රු) | 2009(රු) | 2008(රු) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 73,055,142 | 47,203,906 | 55,255,338 |
| කෙරෙමින් පවතින වැඩ | 58,578,991 | 23,770,000 | 23,770,000 |
| ආයෝජන | 63,907,154 | 63,907,154 | 27,250,000 |
| භාණ්ඩාගාර බිල්පත් | | - | 31,019,470 |
| | 195,541,287 | 134,881,060 | 137,294,808 |
| **ජංගම වත්කම්** | | | |
| ලැබීමට ඇති දෑ | 2,760,635 | 4,359,058 | - |
| වෙනත් ජංගම වත්කම් | 8,476,312 | 8,050,621 | - |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 34,104,235 | 16,386,215 | 7,322,641 |
| | 45,341,182 | 28,795,894 | 19,696,220 |
| **මුළු වත්කම්** | 240,882,469 | 163,676,954 | 156,991,028 |
| **බැරකම්** | | | |
| **ජංගම නොවන බැරකම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 4,127,188 | 3,588,118 | 3,105,000 |
| | 4,127,188 | 3,588,118 | 3,105,000 |
| **ජංගම බැරකම්** | | | |
| වෙනත් ගෙවිය යුතු දෑ | 7,162,826 | 13,689,283 | - |
| කෙටි කාලීන ප්‍රතිපාදන | 438,518 | 355,000 | - |
| ඉඩම් අත්පත් කර ගැනීම මත තැන්පතු | 2,547,750 | - | - |
| | 10,149,094 | 14,044,283 | 35,646,489 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| සමුච්චිත අරමුදල | 76,268,522 | 83,316,299 | 79,792,412 |
| එකතු කළා: ශුද්ධ අතිරික්තය/ හිඟය | | - | (4,746,429) |
| විලම්භිත ප්‍රදාන | 128,431,867 | 45,392,468 | 43,193,556 |
| ශුද්ධ අතිරික්තය | (7,508,558) | 788,111 | |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල | 29,414,356 | 16,547,675 | - |
| | 226,606,187 | 146,044,553 | 118,239,539 |
| **මුළු ස්කන්ධය සහ බැරකම්** | 240,882,469 | 163,676,954 | 156,991,028 |

| | | |
|---|---|---|
| සමුච්චිත අරමුදල | 65,696,858 | |
| ශුද්ධ අතිරික්තය | 3,063,106 | |
| විලම්භිත ප්‍රදාන | 128,431,867 | |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල | 29,414,356 | 226,606,187 |
| **ජංගම බැරකම්** | | |
| වෙනත් ගෙවිය යුතු දෑ | 7,162,826 | |
| කෙටි කාලීන ප්‍රතිපාදන - විගණන ගාස්තු | 438,518 | |
| ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා තැන්පතු | 2,547,750 | 10,149,094 |
| **මුළු ස්කන්ධය සහ බැරකම්** | | 240,882,469 |

**<u>20xx/12/31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා අතීතයට බලපාන පරිදි ප්‍රතිප්‍රකාශිත ආදායම් ප්‍රකාශනය</u>**

| | 2010(රු) | 2009(රු) |
|---|---|---|
| **ආදායම්** | | |
| ව්‍යාපෘති වියදම් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන | 79,691,685 | 62,902,359 |
| ක්‍රමක්ෂිත විලම්භීත ප්‍රදාන | 21,258,113 | 7,374,841 |
| පුනරාවර්තන ප්‍රදාන | 46,740,000 | 47,100,000 |
| වෙනත් ආදායම් | 29,059,774 | 10,914,038 |
| **මුළු ආදායම** | **176,749,572** | **128,291,238** |
| **වියදම** | | |
| ව්‍යාපෘති වියදම් | (83,360,030) | (42,815,100) |
| වැටුප් සහ දීමනා | (38,422,077) | (31,608,871) |
| ගමන් වියදම් සහ යැපීම් | (1,791,027) | (1,333,996) |
| සැපයුම් | (3,424,733) | (6,533,876) |
| නඩත්තු වියදම් | (3,987,951) | (4,009,507) |
| කොන්ත්‍රාත් සේවා | (15,844,812) | (12,212,771) |
| ක්‍රමක්ෂය වියදම් | (40,894,921) | (21,149,073) |
| වෙනත් පුනරාවර්තන වියදම් | (1,637,281) | (3,092,258) |
| **කාල පරිච්ඡේදය සඳහා වියදම** | **(189,362,832)** | **(122,755,452)** |
| පසු ගිය වර්ෂයේ ගැළපීම් | - | |
| **අතිරික්තය/ (හිඟය)** | **(12,613,260)** | **5,535,786** |

ඊඑච්/අයි/එස්එල්එස්ඊඒ/එෆ්ඒ/2012 2014 නොවැම්බර් 25 දින

සභාපති,

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) 2012 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2013 නොවැම්බර් 29 දින නිකුත් කරන ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2 මූල්‍ය ප්‍රකාශන

--------------

2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හම්බන්තොට "සෝලර් පාක් ව්‍යාපෘතිය " සඳහා මහවැලි අධිකාරියෙන් අත්පත් කරගත් අක්කර 50 ක ඉඩම සහ එහි ඉදිකරන ලද ගොඩනැඟිලි අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) සම්පූර්ණයෙන් හානි වූ සුළං බල කුළුණ (Wind Tower) ස්ථාවර වත්කම් ගිණුමෙන් ඉවත් කර නොතිබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දේපල, පිරියත හා උපකරණ රු.2,377,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) රු.55,507,154 ක සම්බන්ධිත ආයෝජනයට අනුකූලව ශ්‍රී ලංකා සුනිත්‍ය බල ශක්ති සහතික කිරීමේ අරමුදල අධිකාරියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනම දක්වා නොතිබුණි.

2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

--------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.12,449,801 ක් හා රු.47,058,212 ක් වූ පිළිවෙලින් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ පිළියෙල කර නොතිබුණි. තවද ලැබිය යුතු

ශේෂවලට අදාළව සනාථ කිරීම්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් මෙම ශේෂ පිළිබඳ නිරවද්‍යතාවය හා විශ්වාසනීයත්වය විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

2.2.3 නොසැසඳූ වෙනස්කම්

---------------------------

පෙර වර්ෂය සඳහා ශේෂ පත්‍රයෙහි දැක්වෙන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලේ ආරම්භක ශේෂය හා සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල සටහන් - 11 හි දැක්වෙන අනුරූපී මුදල අතර රු.14,714,220 ක වෙනසක් නිරික්ෂණය විය.

2.3 නීති, රීති, හා රෙගුලාසි වලට අනුකූල නොවීම

---------------------------------------------------

1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය අනුව සෑම රාජ්‍ය සංස්ථාවක් විසින්ම සෑම මුදල් වර්ෂයක් සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු අතර, අයවැය ලේඛනය අදාළ වන මුදල් වර්ෂය ආරම්භවීමට මාස තුනකට පෙර එම ආයතනයේ පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ අයවැය ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 ජනවාරි 26 දින අනුමත කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.20,906,665 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ රු.29,871,505 ක ඌනතාවයක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.50,778,170 ක වර්ධනයක් දැක්වේ. හම්බන්තොට සෝලර් පාක් ව්‍යාපෘතියේ බලශක්ති විකුණුම් ආදායම රු.20,700,600 කින් වැඩිවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

3.2.1 ප්රොටෝටයිප් විදුලි වාහන 3 ක් (Prototype Electric Vehicles) සංවර්ධනය කිරීම

---------------------------------------------------------------------------------------------

මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද පරිදි, ප්‍රොටෝටයිප් විදුලිවාහන තුනක් 2007 සැප්තැම්බර් 28 සිට මාස 18 ක් ඇතුළත සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 7,888 ක මුදලක් එනම් එකඟ වූ මිලෙන් සියයට 87.66 ක් 2009 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබුණි.

විධිමත් කාල දීර්ඝ කිරීමක් නොමැතිව, ව්‍යාපෘති කාල පරිච්ඡේදය වර්ෂ 4 කට ආසන්න කාලයක් වැඩිපුර ඇදී ගොස් තිබුණද, 2013 මැයි 26, විගණන පරීක්ෂණ දිනය දක්වා එක් වාහනයක් හෝ නිම කිරීමට සංවර්ධකට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

### 3.2.2 සුළං මනින කුඹ (Wind Measuring Masts ) 10 ක් සැපයීම, පෙර සැකසීම, සවිකිරීම හා පැවරීම

------------------------------------------------------------------------------------------------------------

මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදුන් දුර්වලතාවයන්ට අමතර වශයෙන් මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(අ) 2013 පෙබරවාරි මාසය වන විට සුළං මනින කුඹ 3 ක් පමණක් අවශ්‍ය දත්ත කාර්යක්ෂමව ඉදිරිපත් කර තිබුණි.

(ආ) සුළං මනින දත්ත රැස්කිරීම පිළිබඳ භෞතික කාර්ය සාධනය සියයට 51 ක මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. එබැවින් සුළං මනින කුඹ ස්ථාපිත කිරීම සඳහා ස්ථාන හඳුනා ගැනීම, සුළං මැනීම් දත්ත රැස්කිරීම හා එම දත්ත වාර්තාකරණය ආදී අපේක්ෂිත අරමුණු සුළං මනින කුඹ ස්ථාපිත කිරීම මඟින් ඉටුකර ගැනීමට අධිකාරියට නොහැකිවී තිබුණි.

(ඇ) නාඩුකුඩා හි සවිකරන ලද කුළුණ අවශ්‍ය ප්‍රමිතියට නොවීය. එබැවින් එය 2012 අප්‍රේල් 27 දින ඉවත් කර අළුත් කුළුණක් සවිකර තිබුණි. කුළුණේ ඉවත් කරන ලද කොටස් මළකඩ බැඳී තිබූ අතර "ස්ටේ වයර්" 15 ක් භෞතික පරීක්ෂණය සඳහා විගණනයට ඉදිරිපත් කිරීමට අධිකාරියට නොහැකි වී තිබුණි. තවද නාඩුකුඩාහි කුළුණ ස්ථාපිත කිරීමට දරන ලද රු.2,377,000 ක් වූ පිරිවැය ඵලරහිත වියදමක් බවට නිරීක්ෂණය විය.

### 3.2.3 පුනර්ජනනීය බල ශක්ති ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම

----------------------------------------------------------------------

අධිකාරිය වෙනුවෙන් රජය විසින් ක්‍රියාත්මක කළ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නියාමනය කිරීමට නොහැකිවීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා අපේක්ෂිත ව්‍යාපෘති 11 කින් පුනර්ජනනීය බලය සම්බන්ධයෙන් ව්‍යාපෘති 6 ක් 2009 සිට 2012 දක්වා කාල පරිච්ඡේදය තුළදී අත්හැර දමා තිබුණි.

### 3.2.4 "ස්විච් - ඒෂියා" වැඩ සටහන (Switch - Asia Programme )

-----------------------------------------------------------------------

මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද පරිදි "ස්විච් ඒෂියා" වැඩ සටහන යටතේ ලැබුණු රු.7,334,354 ක මුදලින් රු.3,135,202 ක මුදලක්, 1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ හා 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ/5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව 2010 හා 2011 වර්ෂ තුළදී අධිකාරියේ සියළු නිලධාරින් සඳහා වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි.

මෙම ගෙවීම සියළු නිලධාරින්ගෙන් හෝ අධිකාරියේ සභාපතිගෙන් අයකර ගැනීමට, විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් ඔහුගේ 2012 දෙසැම්බර් 03 දිනැති අංක පීඊ/අයිඒ/22/vol .11 දරන ලිපියෙන් අධිකාරියේ සභාපති වෙත උපදෙස් දී තිබුණි. කෙසේ වුවද මෙම බලය නොලත් ගෙවීම අයකර ගැනීම සඳහා විගණන පරීක්ෂණ දිනය වන 2013 නොවැම්බර් 20 දක්වා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය (HRM)

----------------------------------------------

අධිකාරියේ විධිමත් කාර්ය මණ්ඩල කළමනාකරණයක් ක්‍රියාත්මක නොවූ අතර අධිකාරියේ වර්තමාන බඳවා ගැනීම් පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි.

### 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලේ හා ශ්‍රී ලංකා සුනිත්‍ය සහතික අරමුදලේ ආයෝජනයන්ගෙන් 2008 සිට 2012 කාල පරිච්ඡේදය දක්වා ලැබී තිබුණු රු.36,208,817 ක් වූ පොලී ආදායම අදාළ අරමුදල්වලට ප්‍රේෂණය කිරීමෙන් තොරව අධිකාරිය විසින් උපයෝජනය කර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

**4.1** අයවැය ලේඛනමය පාලනය

---

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

**4.2** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5 වගන්තිය අනුව, කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා ගිණුම් මුදල් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 12 දින විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබු අතර පසුව එම මූල්‍ය ප්‍රකාශන ඉවත් කර ගෙන සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 25 දින නැවත ඉදිරිපත් කර තිබුණි.

**5.** පද්ධති හා පාලන

---

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු, මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මඟින් අධිකාරියේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) අයවැය ලේඛනය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

(ඈ) ගිණුම්කරණය

(ඉ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(ඊ) මානව සම්පත් කළමනාකරණය

(උ) ගෙවීම් පරිපාටිය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

වැඩ බලන විගණකාධිපති

මගේ අංකය : SEA/IA/CH/14/02

2014. 08.25

විගණකාධිපති

විගණකාධිපති දෙපාර් තමේන්තුව

306/72

පොල්දූව පාර

බත්තරමුල්ල

මත්මයාණෙනි,

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වලන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්ථාව

උක්ත වාර්ථාවට අදාල පිළිතුර මේ සමග ඉදිරිපත් කරමි.

ප්‍රසාද් ගල්හේන

සභාපති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

පිටපත : 01. ආර්, එම්. රත්නායක මහතා - සහකාර විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව

02. ලේකම් - පරිසර හා පුණර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

## 1.1 මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

### 1.1.1 ගිණුම්කරණ ප්‍රමිති

(අ) ඉහත දැක්වෙන ඉඩම සඳහා කැබිනට් අනුමැතියක් ලබාගෙන ඇත. අයිතිකර ගැනීමේ ක්‍රියාදාමය SLSEA මගින් ආරම්භ කර ඇති අතර ඉඩමේ ඔප්පුව මහවැලි අධිකාරියෙන් ලැබෙන තුරු බලාපොරොත්තුවෙන් සිටි. ඉඩමේ ඔප්පුව ලැබෙනතුරු මිල තක්සේරු කල නොහැකිය. ඉහත ඉඩම ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුළත් කරණු ලබන්නේද යන්න ඉඩම තක්සේරු කිරීමේ ක්‍රියාදාමයේ නිගමනයට අනතුරුව තීරණය කරණු ලැබේ.

(ආ) බැංකුව මගින් නැවත පොලියද දැනට වත්කම් ලෙස සලකා ඇත. නමුත් ගිණුම් සටහනේ මෙම අගයන් පොලී ආදායම් සහ පොලී ආයෝජන ලෙස වෙන් වෙන් ව සඳහන් කර ඇත. දැනට වත්කම් වල සම්පූර්ණ අඩුවීම පහත පරිදි වේ.

| | |
|---|---|
| වර්ථමාන වත්කම්වල දළ අඩුවීම | 19, 251, 156 |
| පොළි ආදායම | 5, 782, 567 |
| පොළි ආයෝජන ආදායම | 4, 863, 516 |
| වර්ථමාන වත්කම්වල ශුද්ධ අඩවීම | 20, 170, 207 |

(ඇ) රුː 42 140 932.00 ලෙස දැක්වෙන අගය ආදායම් ප්‍රකාශයට අපගේ කෙටුම්පත් මූල්‍ය ගිණුම්වලින් යොමු කර ඇති බව පෙනී යයි. අවසාන ආදායම් ප්‍රකාශයෙන් දැක්වෙන අගය වන්නේ රුː 37, 502 139/- මේ නිසා අවසාන ගිණුම්වල රජයෙන් වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදනවලින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශකර වැඩි අගයක් සටහන් නොවේ.

(ඈ) අප විසින් අපගේ පොදු ලෙජරයේ සඳහන් ඉඩම, ශාක සහ උපකරණ සහ සිදුකරමින් පවතින වැඩ යන මූල්‍ය ආයෝජන ගණන් නැවත පරීක්ෂා කල අතර සඳහන් අගයන් පහත පරිදි වන බව කාරුණිකව දන්වා සිටිමි.

| | |
|---|---|
| හම්බන්තොට සූර්ය පැනල ජාලය | 3, 557, 151 |
| ඉඳුරාණ කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය | 7,310,372 |
| මුළු ආයෝජිත වියදම | 10,867,523 |

(ඉ) ඉහත රුː 110, 000/- ක ඉල්ලුම් පත් මුදල පවත්වා ගත හැකි ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල (පුනර්ජනනීය බලශක්ති ආදායම) යටතේ සටහන් කිරීම මගින් පොදු ලෙජරයේ නිවැරදි කර ඇති අතර මේ නිසා මූල්‍ය ප්‍රකාශයේ දැක්වෙන මුළු වැඩිවීමට බලපෑමක් ඇති නොකරයි.

(ඊ) 3.1 ːi) විගණන වාර්ථාවේ 13 (7) (අ) නිරීක්ෂණයේ සඳහන් වන්නේ අතිරේක දීමනාවල රුː 535, 033 රු-ක් අඩුවෙන් සටහන් වී ඇති බවයි. නමුත් 14 (2) (ඇ) වාර්ථවේ සඳහන් වන්නේ එම ප්‍රතිපාදන වැඩිවීමක් යටතේ වී ඇති බවයි. අප විසින් නිරීක්ෂණය කලේ අපගේ කෙටුම්පත් ගිණුම්වල වැරදිමකින්

රු: 567, 202.00 වැඩියෙන් සටහන් කර ඇති බවයි. මෙම දෝෂය වැඩිපුර සටහන් කළ අගය නිවැරදි කිරීම මගින් නිවැරදි කරන ලදි.

(උ) මෙම අලාභය වාර්තා කර අතර FR 109 ඉල්ලුම් පත අමාත්‍යාංශයට යවන ලදි. FR 109 අනුමැතිය ලැබීමෙන් පසු මෙම අගය ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඌ) මූල්‍ය ප්‍රකාශයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් ආදී අගයන් පොදු ලෙජරයෙන් ගෙන ඇති අතර ස්ථාවර වත්කම් ලේඛණයෙන් ගෙන නොමැත. ඔබගේ වාර්ථාවේ නිවැරදිව පොදු ලෙජරයේ ගිණුම් ගත කර ඇති අතර ස්ථාවර වත්කම්වල මුළු අගයේ ඇතුළත්ය.

(ඔ) රු: 377, 400/- ක මුදල ගෘහ භාණ්ඩ ගිණුම්වලින් පරිගණක උපකරණ මිළදී ගැනීමේ ගිණුමට මාරු කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ස්ථාවර වත්කම්වල අඩුවීම සකස් කිරීම මගින් ජනල් සටහන්වල අතිරික්තය නිවැරදි කර ඇත.

**1.1.2** ලැබීම් සහ ගෙවීම්

**(i)** ලැබීම් සහ ගෙවීම් ශේෂවල කාල විශ්ලේෂණය පිළියෙල කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

**1.1.3** නීති රීති හා රේගුලාසි පිලි නොපැදීම

මූල්‍ය වර්ෂය ආරම්භ වීමට මාස තුණකට පෙර අයවැය පිළියෙල කර ගතයුතු අතර අයවැය සීමාව මහා භාණ්ඩාගාරයෙන් ලිඛිතව ලබා ගත යුතුව ඇත. නමුත් දැනට අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගය වන්නේ අයවැය නොවැම්බර් මස පාර්ලිමේන්තුවේදී අනුමත වූ පසු ඉදිරිපත් කිරීමයි. සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේදී අනුමත වන්නේ නොවැම්බර් මස වන අතර ඒ වනතෙක් අධ්‍යක්ෂ මණ්ඩලයට අයවැය අනුමත කිරීමට බලය නොමැත. එම නිසා මෙම විදිවිධානය අනුගමනය කිරීම අපහසුය.

**2** මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

**2.1** මූල්‍ය සමාලෝචනය මූල්‍ය ප්‍රතිඵල

විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ප්‍රමාණවත්ය

**2.2** මෙහෙයුම් සමාලෝචනය

**2.2.1** විද්‍යුත් වාහනවල මූලාකෘති තුනක් ඉදිරිපත් කිරීම

මෙම කාර්යය භාරගත් සැකසුම්කරු වැසි සමූහය ධාවන රෝද පොළ සම්පූර්ණ කිරීමට 2013 නොවැම්බර් 25 දින සමත් වූ අතර මෙම ජයග්‍රහණය පහත වීඩියෝ දර්ශනයෙන් දැක ගත හැකිය. http://youyu.be/nrYFROJL25

මූල්‍ය සීමා නිසා මෙම සැකසුම්කරු වැසි සමූහය මූලික සැකසුමට සම්බන්ධ කිරීම ඉතා සෙමින් දැනට සිදුකරමින් පවතී. ගිවිසුම් කඩවීම් සම්බන්ධව නීති ක්‍රියාමාර්ග ගෙන එය ඇටනි ජනරාල් දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර එය ඇටනි ජනරාල් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර එය ඇටනි ජනරාල්තුමා මගින් 2014 ජූලි 30 දින පිළිගන්නා ලදි. **(Ref. C/154/14/SLSEA)** කෙසේ වෙතත් ව්‍යාපෘතියේ එම නිගමනයන් මෙම වසරේදී බලාපොරොත්තු විය හැකිය.

**2.2.2** සුළං බල කුළුණු දහයක් සැපයුම, පිරිසැකැසුම, හා සවිකිරීම

(අ) සියළු සුළං කුළුනු අන්තර්ජාලය හරහා දත්ත එකතු කිරීමේ පහසුකම් සහිතය. තවද අන්තර්ජාලය හරහා දත්ත එකතු කිරීම එම ස්ථානයේ සංඥා දුබලතාව මත රඳ පවතී. එවැනි අවස්ථාවක් ඇතිවූ අවස්ථාවන් හීදී දත්ත එකතු කිරීම භෞතිකව කල යුතුය. විමර්ශණය සිදුකරන අවස්ථාවේදී සුළං මැනීමේ කුඹ 3ක් මෙකී අන්තර්ජාලය හරහා දත්ත ඉදිරිපත් කරන ලදි.

(ආ) සුළං මැනීමේ කුඹ ක්‍රියාකිරීම සඳහා ඉඩම ලබාදීමේ වගකීම අධිකාරිය සතුය. නමුත් උතුරු සහ දකුණු පලාත්වල ආරක්ෂක හේතූන් මත ඉඩම් කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදීමට නොහැකිවී ඇත. මේ හේතුවෙන් කුළුනු කිහිපයක් ක්‍රියාත්මක කිරීම අඩපණ වී ඇත. කෙසේ වෙතත් සුළං මැනිමේ දත්ත එකතු කිරීමේ සාමාන්‍ය අගය 57% වූ අතර මෙය පිළිගතහැකි මට්ටමකි.

(ඇ) නාඩුකුවා කුළුන 2011.03.15 දින ස්ථාපිත කර අතර එයින් 2014.04.27 දක්වා දත්ත රැස්කරන ලදි. කුළුනේ උස මීටර් 50 කි. ආසියානු සංවර්ධන බැංකුවේ ව්‍යාපෘතියක් මගින් ස්ථාපිත මීටර් 80ක් පමණ උස කුළුනද එම ස්ථානයේදීම ඉදි කර ඇති උසම කුළුන මගින් වඩාත්ම කාර්‍යක්ෂම ලෙස දත්ත රැස් කරනු ලැබේ. ඉහත කරුණු සලකා බලා කුඩා කුළුන ඉවත්කර ආසියානු සංවර්ධන බැංකුව මගින් ස්ථාපිත කුළුනු අධිකාරියට පවරා දීමට කටයුතු කරමින් පවති. ලෝහ කම්බි 15ක් අධිකාරියේ ගබඩාවේ ගබඩා කොට ඇති අතර ඒවා රිසි අවස්ථාවකදී නිරවද්‍යතාවය පරීක්ෂා කළහැකිය.

**2.2.3** පුනර්ජනණිය බලශක්ති ව්‍යාපෘති සඳහා භූමිය ලබා ගැනීම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පනතේ අංක 30 වගන්තියට අනුව අධිකාරිය මගින් පොදු කාර්යයන් ලෙස සලකන ඕනෑම කටයුත්තක් සඳහා ඉඩම් ලබාගැනීම, ඉඩම් පවරා ගැනීමේ පනත අනුව පවරා ගත හැකි පෙර අත්දැකීම් අනුව මෙම ක්‍රියාදාමය සඳහා අවම වශයෙන් සති 72ක කාලයක් ගත වන බව නිරීක්ෂණය කර ඇත. පවරා ගැනීමේ ක්‍රියාදාමය ආයතන සෘජු දායකත්වය මත රඳා පවතී. එනම් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, පවත්නා ප්‍රදේශයේ ප්‍රදේශීය ලේකම් කාර්යාලය, මිනුම්පති දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, තක්සේරු දෙපාර්තමේන්තුව, රක්ෂණ සමාලෝචන මණ්ඩලය, ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව, ඇටනි ජනරාල් දෙපාර්තමේන්තුව ඇතුළු තවත් ආයතය මගිනි.

ඉඩම් පවරා ගැනීමට මුදල් යොදවන ලද ව්‍යාපෘති එකොලහෙන් තුනක් ඉවත් විය. ඒ සැකසුම් කරුවන් ඔවුන් විසින්ම ඉඩම් මිලදී ගැනීම නිසාය. තවත් ව්‍යාපෘති තුනක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් ඉඩම් පවරා ගැනීම අවශ්‍ය ද යන්න සැකසුම්කරුවන්ගෙන් විමසා ඇති අතර, ඔවුන්ගෙන් ප්‍රතිචාර බලාපොරොත්තුවෙන් සිටී. අනෙකුත් ඉඩම් පවරා ගැනීමේ ක්‍රියාදාමය සිදුකෙරෙමින් පවති.

**2.2.3** ස්විච් - ඒෂියා වැඩසටහන

මේ පිළිබඳව විගණකාධිපතිතුමාගේ අදහස වුයේ ලේකම්තුමාගේ උපදෙස් පරිදි ක්‍රියා කිරීමට සහ මහා භාණ්ඩාගාරය සහ ලේකම්තුමා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව පිළිගත හැනි විසඳුමකට පැමිණෙන ලෙසයි. ඒ අනුව අදාල ක්‍රියාමාර්ග සාකච්ඡාවට ගත් අතර එහි විස්තර පහත දැක්වේ.

කාර්යය සිදුවූ ආකාරය පිළිබඳ බලශක්ති අමාත්‍ය ලේකම්තුමා 05.12.2012 දින ලිපියකින් දැනුවත් කර අතර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය 24.12.2012 දින බලශක්ති අමාත්‍යාංශ ලේකම්තුමා මගින් මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමාගෙන් ඉල්ලා සිටින ලදි. ඉන්පසු ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පරිසර අමාත්‍යාංශය යටතට පැවරුණු පසු නැවත ලිපියක් අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් පරිදි එම අමාත්‍යාංශය හරහා ද යවන ලදි. ඒ අනුව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගන්නා ලදි.

### 2.2.3 කළමණාකරණ අකාර්‍යක්ෂමතා

මෙය 2008 සිට ක්‍රියාකාරීත්වයේ දක්නට ලැබේ. මෙම අරමුදලේ පොලිය භාවිතා කර සැපයුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ක්‍රියාකිරීම වියදම පියවා ගන්නා අතර ඉල්ලුම් පත්‍ර ගාස්තු බලශක්ති අරමුදලට බැර කරනු ලැබේ.

## 2.3 මානව සම්පත් කළමනාකරණය (HRM)

බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය ඉක්මනින් පිළියෙල කිරීමට කටයුතු කරනු ඇති අතර බඳවා ගත හැකි සේවක ගණන සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ගෙන ඇත.

## 2.4 අන්තර් විගනණයන්

අභ්‍යාන්තර විගණන විධායක නිලධාරියෙක් 02. 12. 2012 දින කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇත. ඊට අමතරව එක් කළමණාකරණ සහකාර නිළධාරියෙක් අභ්‍යාන්තර විගණන අංශය සඳහා තාවකාලිකව අනුයුක්ත කර ඇත. අභ්‍යාන්තර විගණන විධායක නිලධාරියෙකු බඳවා ගැනීමෙන් අනතුරුව, විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් 5ක් පවත්වා ඇති අතර, විගණකාධිපතිගේ සහ කොප් කමිටුවේ විමසීම් සහ නිරීක්ෂණ රැසක් පිළිබඳව එම කාලය තුළ කටයුතු කර ඇත.

## 2.5 අයවැය පාලනය

මුදල් ගිණුම මහා භාණ්ඩාගරයෙන් නොලැබීම සහ සැලසුම් කල කටයුතු කිරීමට අවශ්‍ය කරන සම්පත්වල අඩුපාඩු නිසා අයවැය ආදායම් ලබා ගැනීමට නොහැකි විය. මෙයට අනෙකුත් රාජ්‍ය ආයතන වලින් බලශක්ති අවසර පත් ලබාගැනීමේදී ඇතිවූ ප්‍රමාදවීම්ද හේතුවිය.

අයවැය වියදම් අත්තර ගත් වියදම් කලින් අවුරුදු වල සිට ඉදිරියට ගෙන ඒම නිසා ඉතා සුළු ප්‍රමාණයකින් ඉක්මවා ගොස් ඇත. මෙය අපේක්ෂා නොකල ලෙස සැපයුම්කරරුවන්ගේ මිල ඉහල දැමීම නිසා විය.

# 3 පද්ධති සහ පාලනය

විගණකාධිපති විසින් නිරීක්ෂණය කල පද්ධති සහ පාලන ඌනතා නිවැරදි කිරීම සඳහා මේ වන විටත් පියවර ගෙන ඇත.